# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ නවම් අව අටවක පෝද 2023 පෙබරවාරි 13 සඳුදා BUDUSARANA MONDAY FEBRUARY 13, 2023
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 34 පත්‍රය , ආරම්භය 1965 - 06 - 13




අනුරාධපුර ථූපාරාම සෑරදුන් වහන්සේ

සේයාරුව
නිශ්ශංක විජේරත්න



# උසස් ප්‍රතිපදාවක මාහැඟි සංකේතය පාත්‍රයේ පුරාණය



දඩල්ල වාලුකාරාම වෙහෙර වැසි
ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**

**පාත්‍රයට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. බුද්ධ කාලයටත් පෙර පාත්‍රය ගැන සඳහන් වන නිසා පාත්‍රය යන වචනය හුදු සාසනික ව්‍යවහාරයක්ම නොවේ. දඹදිව් වැසියා පාත්‍රය යන වචනය භාවිත කොට ඇත්තේ ආහාර අනුභවය සඳහා පාවිච්චි කරන ලද භාජනයකට ය.**

අද භික්ෂූන් වහන්සේ දානය වළඳන භාජනයට පාත්‍රය යැයි කියනු ලැබේ. අද ගිහි ජනතාව ආහාර ගන්නා භාජනයට පාත්‍රය යන නම ව්‍යවහාර නොකරයි. එහෙත් අතීතයේ දී පැවිදි නො පැවිදි භේදයක් නොමැතිව ආහාර අනුභවය සඳහා යොදාගන්නා භාජනය පාත්‍රය යන නාමයෙන් හැඳින්වීය.

සිඟමන සඳහා ද පාත්‍රය පාවිච්චි කළ බව පෙනේ. “හිඟන්නාගේ පාත්තරයට සෙනසුරා වැටුණා වාගේ” යන කියමන් තුළින් එය තහවුරු වේ.

පැවිදි බව ලැබීම සඳහා මූලික අවශ්‍ය භාණ්ඩ අතර පාත්‍රය සහ සිවුරු ප්‍රධාන වේ. ඒවා නොමැතිව පැවිද්ද ලබා ගත නොහැකි ය. සිදුහත් බෝසතාණන් වහන්සේට පැවිදි වීමේ දී ඝටීකාර බ්‍රහ්මයා පාත්‍රය, සිවුරු පූජා කළ බව සඳහන් වේ.

පැවිදි වූ බෝසතාණන් වහන්සේ අනුපිය අඹ වනයට පිවිස සතියක් පමණ එහි වැඩ සිට පැවිද්දෙන් අටවැනි දින රජගහ නුවර පිඬු සිඟා වැඩිය බව සඳහන් වේ. මේ අනුව පැවිද්දේ ප්‍රධානම අංගය වනුයේ පිඬුසිඟා යැපෙන ආහාරයෙන් හෙවත් පිණ්ඩපාත දානයෙන් පෝෂණය වීමයි.

“පිණ්ඩියා ලෝප භෝජනං නිස්සාය පබ්බජ්ජා” යැයි දක්වා ඇති පරිදි පැවිද්ද පිණ්ඩපාත භෝජනය නිසා පවතින දෙයකි. පිඬුසිඟා යාම භික්ෂු ආජීවය පාරිශුද්ධියට පත් කරන්නකි. බුදු, පසේබුදු, මහ රහතන් වහන්සේ ගෙපිළිවෙළින් පිඬුසිඟා වැළඳූහ. අදත් එම චාරිත්‍රය අනුගමනය කරන ඇතැම් භික්ෂූන් වහන්සේ පිණ්ඩපාතයෙන් ම යැපෙති.

පිඬුසිඟා යෑම භික්ෂු ආකල්පයක් වුව ද බුදු සමයේ එය අනිවාර්ය අංගයක් ම නොවේ. “දිවි ඇතිතෙක් භික්ෂූන් වහන්සේ පිණ්ඩපාත භෝජනය වැළඳිය යුතු ය” යන දෙව්දත් තෙරුන්ගේ ඉල්ලීම කාරුණිකව ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ කැමැති කෙනකුට එසේ කළාට වරදක් නැතැයි දේශනා කළහ.

දානය සඳහා විශේෂ ආරාධනාවක් නොමැති සෑම දිනයක ම පිඬුසිඟා වැඩම කිරීම බුදුරජාණන් වහන්සේගේ සිරිත විය. කිඹුල්වත්පුර නුවරට වැඩම කළ අවස්ථාවේ කිසිවක් බුදුරජාණන් වහන්සේට පසුදින දානයට ආරාධනා නො කළහ. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවක පිරිස ද පිරිවරා පසුදින පෙරවරුවෙහි පිඬුසිඟා වැඩියහ. එය දුටු යසෝධරා දේවිය සිය මාමණ්ඩිය වූ සුද්ධෝදන රජු වෙත ගොස් “ඔබ පුතුණුවන් මහමඟ පිඬුසිඟා වඩිතියි” කීවා ය. මේ පුවත ඇසූ විගසම කලබල වූ රජතුමා බුදුරජාණන් වහන්සේ වෙත ගොස්

**ගෙයක් ගෙයක් පාසා පිඬුසිඟා යාම මඟින් ගුණදම් රැසක් භික්ෂුව තුළ වර්ධනය වේ. ඒවා අතර ලද දෙයින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය කළ හැකිවීම, ස්වල්ප කටයුතු ඇත්තකු වීම, සැහැල්ලු පැවතුම් ඇතිවීම, සන්සුන් ඉඳුරන් ඇතිවීම, කුලයන් කෙරෙහි නො ඇලීම ආදී ගුණාංගයෝ භික්ෂු ජීවිතය අර්ථවත් කරමින් ඔපවත් ද වේ.**

“ස්වාමීනි, මෙසේ පිඬුසිඟා අපිට ලජ්ජා කරන්නේ ඇයිදැයි” ඇසීය. එවිට

“මහරජ මේ අපේ වංශයේ සිරිත යැයි” බුදුරජාණන් වහන්සේ වදාළ සේක. පසුදින සුද්ධෝදන රජුගේ ආරාධනාවෙන් බුදුරජාණන් වහන්සේ සිය භික්ෂු සංඝරත්නය සමඟ දානය සඳහා රාජ මාලිගාවට වැඩම කළහ.

ගෙපිළිවෙළින් යාම පිඬුසිඟා යෑමේ විශේෂ අංගයකි. ලොකු කුඩා දුප්පත් පොහොසත් භේදයක් නොමැතිව ගෙයක් ගෙයක් පාසා පිඬුසිඟා යාම තුළින් භික්ෂු ජීවිතයේ සාමානාත්මතා ගුණය මැනවින් තහවුරු කරයි. සෑම ගෙයක් ගෙයක් පාසා බත් හැළිවල භික්ෂූන් වහන්සේ වෙනුවෙන් බත් ටිකක් ඇති බව මණිකාර කුලුපගතිස්ස තෙරුන්ගේ කථා පුවතෙහි දැක්වේ.

බුදුරජාණන් වහන්සේ සියලු දේ අතහැර පැවිදි වන කුල පුත්‍රයාගේ ජීවනෝපාය සඳහා පිණ්ඩපාතය අනුදැන වදාළහ. පාත්‍රය පිඬුසිඟා යාමට අවශ්‍යම දෙයකි. ගෙයක් ගෙයක් පාසා පිඬුසිඟා යාම මඟින් ගුණදම් රැසක් භික්ෂුව තුළ වර්ධනය වේ. ඒවා අතර ලද දෙයින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය කළ හැකිවීම, ස්වල්ප කටයුතු ඇත්තකු වීම, සැහැල්ලු පැවතුම් ඇතිවීම, සන්සුන් ඉඳුරන් ඇතිවීම, කුලයන් කෙරෙහි නො ඇලීම ආදී ගුණාංගයෝ භික්ෂු ජීවිතය අර්ථවත් කරමින් ඔපවත් ද වෙති.

පිණ්ඩපාත භෝජනයට හා පිඬුසිඟා යාමට සෑම භික්ෂුවකට ම පාත්‍රයක් තිබිය යුතු ය. පාත්‍රයක් නොමැති අයකු උපසම්පදා නොකළ යුතු බවට ශික්ෂා පදයක් ද පනවා තිබේ. භික්ෂුවකට පාත්‍රයක් තිබිය යුතුය. පිණ්ඩපාත භෝජනය වැළඳිය යුතු යැයි සඳහන් වූවාට වෙනත් ආරාධනා හා සලාක ආදියෙන් ලැබෙන භෝජනයත්, පාත්‍රය හැර විනයානුකූල වෙනත් භාජනත් භික්ෂූන්ට අකැප නැති බව ද මතක තබා ගත යුතු කරුණකි.

භික්ෂූන් වහන්සේ අන්‍යයන් නිසා යැපෙන අයෙකි. යැපීම සඳහා පිඬුසිඟා ජනතාව කරා යා යුතු ය. බුදුරජාණන් වහන්සේ පෙරවරු කාලයෙහි ගමන් බිමන් යාමේ දී පාත්‍රය සිවුරු ගෙනයති.

ඇතැම්හු භික්ෂූන් වහන්සේ අන්‍යයන් නිසා යැපීම අනුමත නො කරති. භික්ෂූන් වහන්සේ ද සෙසු අයමෙන් රැකියාවක් කොට දිවි පවත්වා ගත යුතු යැයි කියන්නෝ බුද්ධ කාලයෙහි ද සිටියහ.

“දිනක් බුදුරජාණන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍රය සිවුරුගෙන කසීභාරද්වාජ බ්‍රාහ්මණයාගේ කර්මාන්ත ස්ථානය යම් තැනක ද එතැනට එළඹියහ. ඒ වේලාවේ කසීභාරද්වාජ බ්‍රාහ්මණයා බත් අනුභව කරමින් සිටියේ ය. බුදුරදුන් එතැනට වැඩිසේක.

පිණ්ඩපාතය පිණිස වැඩසිටි බුදුරජාණන් වහන්සේ දැක උන්වහන්සේට මෙසේ කීවේය.

“ශ්‍රමණය, මම සාන්නෙමි. වපුරන්නෙමි. එසේ කොට අනුභව කරමි. ශ්‍රමණය ඔබ ද එසේ කොට අනුභව කරවයි” කීය. රැකියාවක් නොකර අනුන්ගෙන් යැපෙන පිරිස් රටේ ආර්ථික දියුණුවට බාධාවක් සේ සැලකූ බව ඉහත කතා පුවතින් පැහැදිලි වේ.

මේ අයුරින් උසස් ප්‍රතිපදා රැසක් පාත්‍රය මුල් කරගෙන දක්වා ඇති බැවින් ඒ පිළිබඳ විනය ප්‍රඥප්තීන් විමසා බැලීම වැදගත් ය.

ආහාර අනුභවයට ගන්නා සෑම භාජනයක් ම භික්ෂූන්ගේ පරිභෝගයට සුදුසු විනයානුකූල පාත්‍ර නොවේ. එම භාජන වෙනත් දේ සඳහා පරිහරණය කිරීමට භික්ෂූන් වහන්සේට තහනමක් නැත. එහෙත් පාත්‍රයක් වශයෙන් අධිෂ්ඨාන කොට පරිභෝග කළ යුත්තේ ඉතා කුඩා ද නොවූ, පමණට වඩා මහත ද නොවූ, නියමිත ජාතියෙන් තනන ලද, සෝදා පිරිසුදු කළ හැකි කළු පැහැය ගත් පාත්‍රය යි. ඇතුළත මට්ටම් නැති පාත්තරය භික්ෂූන්ට තහනම් ය.


බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේට නො දැරිය යුතු පාත්‍රා රැසක් දේශනා කොට ඇත. ඒවා අතර, රත්තරනින් සෑදූ පාත්‍රය, රිදී පාත්‍රය, මැණික් පාත්‍රය, පළිඟු පාත්‍රය, ලෝකඩ පාත්‍රය, වීදුරු පාත්‍රය, සුදු ඊයම් පාත්‍රය, කළු ඊයම් පාත්‍රය, තඹ පාත්‍රය, දැවයෙන් කළ පාත්‍රය නුසුදුසු ඒවා ය. එසේම ලබු කබල, වළං කබල පාත්‍ර වශයෙන් නොගත යුතු ය. භික්ෂූන්ට පරිභෝජනය කිරීමට සුදුසු පාත්‍රය ලෙස යකඩ පාත්‍රය සහ මැටි පාත්‍රය අනුදැන වදාළහ. යකඩ පාත්‍රය හා මැටි පාත්‍රය යන දෙකෙන් ද මැටි පාත්‍රය වඩාත් සුදුසු ය.

පාත්‍රය පරිභෝග කිරීම සම්බන්ධයෙන් ද ශික්ෂාපද රාශියක් චුල්ලවග්ග පාළියෙහි දක්වා තිබේ. එම ශික්ෂා පද උල්ලංඝනය කෙරේ නම් එම භික්ෂුවට දුකුලා ඇවැත් යැයි වදාරා තිබේ.

පාත්‍රා කොපමණ තිබුණත් අධිෂ්ඨාන කර ගත හැක්කේ නියමිත ජාතියෙන්, නියමිත ප්‍රමාණයට කළ එක් පාත්‍රයක් පමණි. පාත්‍රා කිහිපයක් අධිෂ්ඨාන කළ නොහැකි ය. නියමිත පාත්‍රය හැර අතිරේක පාත්‍රයක් දස දිනක් පමණ දැරිය හැකි ය. එය ඉක්මවන්නාහට පාත්‍රය නිසඟි වේ. පචිති ඇවැත් ද වේ. එමෙන්ම පස් තැනක් පිළියම් නොකළ පාත්‍රයක් ඇතිව අලුත් පාත්‍රයක් ඉල්ලා ගනී නම් ඒ පාත්‍රය නිසඟි වේ. පචිති ඇවැත් ද වේ.

ඉබ්බාට ඉබි කටුව බරක් නොවේ. එය උගේ ආරක්ෂාව පිණිස පවතී. භික්ෂුවට ද පාත්‍රය හා තුන්සිවුර බරක් නොවේ. ඒවා භික්ෂුවගේ ආරක්ෂාව පිණිස පවතී. අල්පේච්ඡ සැහැල්ලු දිවි පෙවෙතක් ගත කරන භික්ෂුවට පාත්‍රය මාහැඟි ආභරණයකි.

# ආත්මාරක්ෂාවට හොඳම ආයුධය



**බුදුරජාණන් වහන්සේ සියලු දෙනාට ම සතුන් මැරීමෙන් වැළකීමට අවවාද කළ සේක. එම අවවාදය සියලු දෙනා ම පිළිගනිතොත් මිනිසුන් ඔවුනොවුන් මරා ගැනීමක් නො කරනු ඇත. පුද්ගලයකුගේ ජීවිතයට තර්ජනයක් කළ අවස්ථාවක දී වුවද ආත්මාරක්ෂාව සඳහා මිනී මැරුම නො වටින බැව් බුද්ධ දේශනාව යි.**

ආත්මාරක්ෂාවේ ආයුධය කරුණාව යි. මෛත්‍රිය යි. කරුණාව හා මෛත්‍රිය ප්‍රගුණ කරන්නකුට අවාසනාවන්ත අවස්ථාවන් පැමිණෙන්නේ ඉතා කලාතුරකිනි.

මිනිසා තම ජීවිතයට කො තරම් ආදරය කරන්නේ ද යත් ඔහු එය අනුනට යටත් කර ගැනීමට ඉඩ නො දෙයි. ඉතා අවශ්‍ය විටෙක බොහෝ අය ආත්මාරක්ෂාව සඳහා සටන් කරති. සෑම ජීවියකු ම ආත්මාරක්ෂාව සඳහා සටන් කිරීමට හෝ මැරීමට පෙළඹීම ස්වභාවික යි. නමුත් එයින් ඇතිවන කර්ම විපාකයන් ඔවුන්ගේ වේදනා මත රඳා පවතී.

කෙනකු තම ආරක්ෂාව සඳහා සටන් කරන විට ප්‍රතිවාදියා මරණයට පත්වුවහොත් මැරීමේ අදහසක් නො තිබුණි නම්, එම මරණයට ඔහු සම්පූර්ණ වගකිවයුත්තා නො වේ. අනිත් අතට මැරීමේ චේතනාවක් ඇතිව වෙන කවර හේතුවක් යටතේ මැරුව ද එහි කර්ම විපාකයෙන් ඔහුට බේරීමක් නැත. එහි ප්‍රති විපාකයට මුහුණ දිය යුතු ය.

අප මතක තබාගත යුත්තේ මොන හේතුවක් නිසා වුව ද මැරීම ජීවිතය නැති කිරීමක් බවයි. අනුමැතියක් නො මැතිව මරා දැමීම මනුෂ්‍ය ඝාතන යැයි කියති.

මිනී මැරුමට දෙන දඬුවම මරණීය දණ්ඩන යයි කියති. අපේ සොල්දාදුවන් සතුරන් විසින් මරනු ලැබූ විට අප එය හඳුන්වන්නේ ඝාතනයක් ලෙස ය. මැරීම අප විසින් අනුමත කළ විට අපි එයට යුදයැයි කියමු. මේ වචනවලින් අපගේ අපේ යන ආවේග අන්තර්ගතය අස්කළහොත් ඒ සියල්ල කිසියම් මැරීමක් ලෙස අපට අවබෝධ කර ගත හැකි ය.

බොහෝ උගත්තු හා ඇතැම් ආගමික දේශක වු ද නිර්වින්දන මැරීම, සානුකම්පික මැරීම, මෘදු හිතින් මැරීම, වේදනා රහිත මැරීම, යනුවෙන් ජීවිතක්ෂයට පත් කිරීම, සාධාරණ බව ඔප්පු කිරීමට ඔවුහු උත්සාහ කරති. ඔවුන් තර්ක කරන්නේ මරණයට ගොදුරු වන්නාට වේදනාව නො දැනේ නම් බෙල්ල කපන පිහිය හොඳට මුවහත් නම්, මැරීම සාධාරණ බවයි. බුදුසමය එ වැනි තර්ක පිළිගන්නේ නැත. මෙහිදී අවශ්‍ය වන්නේ මරණය සිදු කෙළේ කෙසේද යන්න නොව එකකුගේ ජීවිතය තවකකු විසින් නැසීමයි. සිරුරෙන් ජීවිතේන්ද්‍රිය වෙන් කිරීම යි. එසේ කිරීමට මොන ම හේතුවක් මත හෝ කිසිවකුටත් අයිතියක් නැත.

**කේ.ශ්‍රී ධම්මානන්ද හිමි**

# මෙලොව දී ම අනුසස් ලැබෙන අසිරිමත් පින්කමක්



ගාල්ල දංගෙදර , ශ්‍රී ජයවර්ධනාරාම පුරාණ මහා විහාරාධිකාරි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක

**මුතුකණ්ඩියේ සුනෙත්ත හිමි**

**තුන්ලෝකාග්‍ර වූ අප ගෞතම නම් බුදුරජාණන් වහන්සේ බෝධිසම්භාර පුරන කාලයේ දනය මහත් සේ පුරුදු පුහුණු කළහ. දනය යන වචනය ලෝකයේ උතුම්ම වචනයයි.**

ඒ කුමක් නිසාද එය එතරම් වැදගත් වන්නේ? සත්වයාගේ සිතේ ඇතිවන මසුරුමල දුරුකර ගනිමින්, චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමට මහෝපකාරී වෙන නිසයි. දානය ප්‍රධාන වශයෙන් ආමිෂ දානය, ධර්ම දානය, අභය දානය වශයෙන් කොටස් තුනකට බෙදේ. මිනිසුන් විසින් තමන් සන්තක ආහාරපාන ආදී බොහෝ දේ අනුග්‍රහ බුද්ධියෙන් හෝ පූජා බුද්ධියෙන් දන් දෙනු ලබයි.

මේ ලෝකයේ ජීවත් වන මිනිසුන් අතර ඇතැමෙක් උප්පත්තියෙන් ම පොහොසත් ය. ඇතැමෙක් උප්පත්තියෙන් ම දුප්පත් ය, ඇතැමෙක් අධික ලෙස ධනය තිබුණ ද පරිභෝජනය නොකරයි. දන් නොදෙයි. සම්පත් භුක්ති නොවිඳියි. යමකුට උපතින් උරුමකම් කියන මහත් වූ ධනයක් නොතිබුණත් ශ්‍රද්ධාව නමැති ධනයෙන් පොහොසත් පුද්ගලයන් විසින් දන්දීමට සිත් අලවා මෙලොව පරලොව ජයගනී.

ඉතාම දුප්පත් වූ නමුත් ශ්‍රද්ධාවෙන් පොහොසත් වූ දියණියක් තමා සන්තක කෙස් කළඹ දන් දී ලොව සැප විපාක ලබපු ආකාරයේ ඉතාම වටිනා කතා පුවතක් පිළිබඳ සඳහන් වේ.

තෙලප්පනාලි නමින් නියං ගමක් විය. එම ගමේ සිටු දූවරු දෙදෙනෙක් විය. එක් සිටු දියණියක් දුප්පත් සිටු පවුලක ය. අනිත් සිටු දියණිය ධන සම්පත් ඇති සිටු පවුලක ය. දුප්පත් සිටු දියණියගේ කෙස් කළඹ වෙනත් ස්ත්‍රීන්ට වඩා මනාව හොඳින් වැඩී ඇත. මේ දුප්පත් කුමරියගේ ඉතාම අලංකාර කෙස්වැටිය ධනවත් කුමරිය විසින් මුදලට ඉල්ලනු ලැබුවා ය.

විශාල කහවණු ප්‍රමාණයකට වුව ද කෙස්වැටිය මිලට ගන්න යෝජනා වුව ද ඇය කැමැති වූයේ නැත. දිනක් මහා කච්චායන මහරහතන් වහන්සේ ප්‍රධාන තවත් රහතන් වහන්සේ සත් නමක් උජ්ජෙනී නුවරට වැඩම කළහ.

මේ මොහොතේ හිස් පාත්‍ර ඇතිව පිණ්ඩපාතයේ වඩින රහතන් වහන්සේලාට දන් පූජා කිරීමට මෙම දුප්පත් කුමරියට සිතිවිල්ලක් ඇති විය. නමුත් ඇය සතුව දන්දීමට තරම් වටිනා කිසිවක් නොමැත. දැන් මම දන් දෙන්නේ කෙසේ දැයි සිතමින් කල් ගෙවීය. ඇයට ඒ මොහොතේම සිහි වූයේ මනරම් කෙස්වැටිය ඉල්ලා දූතයන් එවූ ධනවත් සිටු කුමරියයි. ඇයට කෙස් කළඹ විකුණා ලැබෙන මුදලින් දන් පූජා කරන්නේ මැයි සිතා රහතන් වහන්සේලාට ආරාධනා කොට වැඩම කරවා ගත්තේ ය. උන්වහන්සේලාට වැඩ සිටින්නට සලස්වන ඇය කාමරයට ගොස් කෙස් වැටය කපා කිරි මවට දී මෙම කෙස් වැටිය ධනවත් සිටු දියණියට දී මුදල් ගෙන එන්නැයි කීවා ය.

කිරි මව ඉතාම දුකින් මේ කෙස් වැටිය ධනවත් සිටු දියණිය වෙත ගොස් දුන්නා ය. එවිට ධනවත් සිටු දියණිය සිතන්නී "මින් පෙර කහවනු දහසකුත් දී මෙම කෙස්වැටිය ගෙන්වා ගන්නට නොහැකි විය. එහෙත් දැන් ළඟට ම ගෙනැවිත් දෙන්නට කුමක් හෝ හේතුවක් ඇති බව වැටහේ. පසුව ඇය මෙම කෙස් කළඹ වටින්නේ කහවණු අටක් යැයි පවසමින් කහවණු අටක් පමණක් දුන්නා ය. කිරිමව ඒ කහවනු අට දියණියට දුන්නා ය. සිටු දියණිය මහ රහතන් වහන්සේ එක් නමකට එක කහවනුව බැගින් වියදම් කරමින් පිණ්ඩපාතය සකස් කොට පූජා කරනු ලැබීය.

මහරහත් කච්චායන තෙරුන් වහන්සේ දුප්පත් සිටු දියණියගේ උපදි සම්පත්ති දැක ඈ කොහේදැයි ඇසීය. ඇය කාමරයේ සිටින බව පැවසීය. එම වෙලාවේ ඇයට එන්න යැයි කීසේක. ඉතාම ගෞරවයෙන් පැමිණ නමස්කාර කොට එකත් පස්ව හිඳි කල්හි ඇයගේ හිස කෙස් මුලින් තිබූ අයුරින්ම පිහිටන්නට විය.

අනතුරුව ඇය බලා සිටිය දී ම මහරහතන් වහන්සේ අහසට පැන නැඟී උජ්ජේනී නුවර චණ්ඩපජ්ජෝත රජුගේ කාංචන නම් උයනට වැඩම කළහ. එම උයනෙහි දානය වළඳන්නට විය. මෙම සිදුවීම දුටු උයන්පල්ලා විසින් රජු වෙත ගොස් ස්වාමීනි ඔබ වහන්සේගේ පුරෝහිත කච්චායන බ්‍රාහ්මණ තෙම පැවිදිව උයනට වැඩම කොට දානය වළඳයි. රජු මේ පුවත අසා ඉතාම ප්‍රීති ප්‍රමෝදයට පත්ව උයනට පැමිණ තෙරුන් වහන්සේට වැඳ විස්තර ඇසුවේය. හිසකෙස් විකුණා දානය පූජා කළ සිටු දියණියගේ කතාව පැවසූහ.

රජු ඇය පිළිබඳ පැහැදී තම රාජධානියේ අග මෙහෙසිය බවට පත්කර ගත්තේ ය. සිටු දියණිය තුන් සිත පහදවාගෙන පූජා කළ දානයේ ආනිශංස මෙලොව දී ම ලැබී ය. මේ කතා පුවත තුළින් අපිට අවබෝධ වන්නේ සසර දන්දීමට පුරුදු වූ පුද්ගලයෝ නිතර නිතර දන් දෙති. ඒ වගේම ප්‍රීති ප්‍රමෝදයට පත්වෙති. කළ පින්කම් පිළිබඳ මෙනෙහි කරමින් සතුටු වෙති. අනුසස් ලබති. තෘෂ්ණාව යටපත් කිරීමේ අභ්‍යාසය. දානයයි නම් හැම දෙනා විසින් එය නිතර නිතර පුහුණු කළ යුතුයි. තමා සන්තක පුංචි දෙය පවා ඉතාම ශ්‍රද්ධාවෙන් දන්දීම තුළින් එය නිවනට හේතුවේ.

**පීති මුදාරං වින්දති දාතා -**
**ගාරවස්මිං ගච්ඡති ලෝකෙ**
**කිත්තිං මනන්තං යාති චදාතා -**
**විස්සසන්යො හෝතිච දානා**

දන් දෙන තැනැත්තා දන් දී මහත් සතුටක් ලබයි. පරලොව ගිය අයට පින් අනුමෝදන් කරවා ඒ අය, දුකින් මිදීමට උදව් වෙනවා වගේම මාගේ පරලොව ගමනට ද පිහිටක් ලැබේවා'යි ප්‍රාර්ථනා කරයි. එයින් නුවණැත්තන්ගේ ගෞරවයට පාත්‍ර වෙනවා වගේ ම කීර්තියට ප්‍රසංසාවට ද ලක්වේ. එපමණක් නොව අලුත් මිතුරන් ඇති වෙනවා වගේම, ලෝකයා විශ්වාස කරන පුද්ගලයෙක් බවට පත් වේ. එවැනි අනුසස් රැසක් දන්දීම තුළින් මෙලොව වශයෙන් වගේම පරලොව වශයෙන් ලැබිය හැකි වේ.



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

නවම් අව අටවක 2023-02-13

## ප්‍රශ්න හමුවේ ජීවිතය මඟහැර නොයන්නට නම්....

ජීවිතය ශක්තිමත් වන්නේ සිත ශක්තිමත් වූ තරමට ය. දුර්වල සිතැත්තන් සුළු අභියෝගයක දී වුව කඩා වැටේ. ගැටලු අර්බුද හමුවේ විසඳුම් සෙවීමෙහිලා පසුගාමී වේ. ව්‍යාකූල වේ. ඇතැම් විට එම ව්‍යාකූලබව තුළ ප්‍රශ්නයට මුහුණ දෙනවා වෙනුවට එය මඟ හරිමින් හොඳම විසඳුම ලෙස සියදිවි නසා ගැනීම දක්වා දැඩි තීරණවලට එළඹීම සිදුවිය හැකි ය.

වර්තමානයේ පමණක් නොව අතීතයේ ද එවැන්නෝ වූහ. ප්‍රශ්නයක් හමුවේ ජීවිතයෙන් පලා යනවා වෙනුවට අභියෝගවලට බිය නොවී මුහුණ දෙමින් ජීවිතය ජය ගන්නටය සම්බුදුදහම අපට මාර්ගෝපදේශ ලබා දෙන්නේ.

බුදුරජාණන් වහන්සේ දවස රජ්ජුමාලා නම් වැඩකාර දියණියක් විය. ඇය සේවය කළ ධනවත් නිවෙසේ ස්වාමි දියණිය දැඩි සිත් ඇත්තී ය. අනුන්ගේ දුක වේදනාව නොහඳුනන්නී ය. ඇයගේ තාඩන පීඩන හමුවේ රජ්ජුමාලා අන්ත අසරණ විය. කෙස්වැටියෙන් ඇද පහරකෑම්වලට ලක්වන ඇය අවසන මනරම් දිගු කෙස්වැටිය ද කපා දැමුවා ය. එහෙත් පීඩාවන්ගේ අඩුවක් නොවුණි. ඇයට ජීවිතය එපා වුණි.

දිනක් ඇය ජලය ගෙන ඒමට යන මුවාවෙන් නිවෙසින් පිටවී වනයට යන්නී ගෙලවැලලාගෙන මියැදීමේ බලාපොරොත්තුවෙනි. එහෙත් සියදිවි නසා ගන්නට සැරසෙන නිමේෂයේ ම ඇය අප තථාගතයන් වහන්සේගේ කරුණාව ලැබ තවදුරටත් ජීවත්වීමේ වාසනාව ලද්දීය.

තම ස්වාමි දියණියගෙන් මේ අසරණ රජ්ජුමාලා විඳි දුක්ගැහැට, පහරකෑම් කෙතෙක් ද යන ඇය ගෙල බැඳි රැහැන් පටින්ම පැහැදිලි වේ. කෙස්වැටිය කපා දැමූ පසු ඇයට පහර දීම පහසු වනු පිණිස ස්වාමි දියණිය ඇයගේ ගෙල බැඳි රැහැන නිසාම රජ්ජුමාලා නමින් ඇය ප්‍රසිද්ධ විය.

සම්බුදුපියාණන් වහන්සේ මේ අසරණ දියණියට පිහිටවූයේ ජීවිතයේ මුහුණදෙන කවර වේදනාකාරී, පීඩාකාරී ප්‍රශ්නයක දී වුව සවිමත් ව මුහුණ දෙන්නට ඇයගේ මනස ශක්තිමත් කරමිනි. ඒ ආදර්ශය සුළු ප්‍රශ්නයක් ඉදිරියේත් ජීවිතයෙන් සමුගන්නට සිතන, අනුන්ගේ ජීවිත උදුරාගන්නට සිතන කා හට වුව ද වැදගත් ය.

බුදුරජාණන් වහන්සේ රජ්ජුමාලාගේ සිත ශක්තිමත් කළේ එම නිවෙසින් හෝ පලානොයන ලෙසට ය. දියණිය ඔබ නැවත නිවෙසට යන්න. වැඩකටයුතු හොඳින් කරන්න. නොපමා වන්න. කිසිවිටෙක අලස නොවන්න. ධෛර්යයෙන් වීර්යයෙන් වැඩ කරන්න. ස්වාමි දියණිය ඔබට පහර දෙන්නේ පවරන වැඩ නිසිලෙස ඉටු නොකරන නිසා විය හැකියි. අද සිට හොඳින් සිතට ගෙන වැඩ කරන්න. රාත්‍රී සියලු දෙනා නින්දට ගිය පසු දොර ජනෙල් හොඳින් වසා නින්දට යන්න. නිවෙස පිරිසුදුව තබා ගන්නවා වගේ ම ඔබ ද මනාව පිරිසුදුව ඉන්න. තවදුරටත් ඇය ඔබ නොතකනවා නම්, පරිභව කරනවා නම් ඇයට මෛත්‍රිය කරන්න. කරුණාවන්ත වන්න. ඉවසන්න. එවිට ස්වාමි දියණිය ඔබට පහර නොදෙනු ඇත. උන්වහන්සේ රජ්ජුමාලාට දේශනා කළ සේක.

මේ අවවාද තුළින් සිදුවූයේ රජ්ජුමාලා පෞරුෂයක් ඇති ශක්තිමත් දියණියක් බවට පරිවර්ථනය වීමයි. තමන්ගේ රාජකාරී නිසිලෙස ඉටුකළ ඇයට ස්වාමි දියණියට මුහුණ දෙන්නට කිසිදු බියක් සැකක් නොවණි. සෘජුව කතා කළ හැකිවුණි. ඒ පරිවර්තනය, දාසිය ස්වාමි දියණියගේ දියණියක ලෙස සලකන්නට තරම් ප්‍රබල වුණි.

ජීවිතයේ අප මුහුණ දෙන ප්‍රශ්න විවිධාකාර විය හැකි ය. කෙනකුගෙන් කෙනකුට වෙනස් ය. එහෙත් ඕනෑම ප්‍රශ්නයකට හොඳම පිළිතුර ශ්‍රී සද්ධර්මයට අනුව සොයා ගන්නවා නම් ජීවිතයට ශක්තිමත්ව මුහුණදීමට අපහසු නොවනු ඇත.

# ජීවිතය උදාරත්වයට පත්වන්නේ ගුණදම් පුරුදු පුහුණු කළ තරමට ය



ක්‍රෝධය, තණ්හාව, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථකාමී බව, ද්වේෂය මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, කාමආශා ආදී දුර්විපාකයන්ට ගොදුරු වූ මනුෂ්‍යයාගේ සිතේ සමබරතාව නැති වී යයි. එයින් සිදුවන්නේ තමන්ට උරුම වූ ශිෂ්ට බව අහිමි වී තිරිසන් සත්වයකුගේ තත්ත්වයට පත්වීමයි.

**හොඳ නරක, කළයුතු නොකළ යුතු දෙය තෝරා බේරා ගන්නට. දියුණුකර ගත හැකි මනසක් අපට තිබේ. තමන් ආඩම්බර විය යුතු වන්නේ, ලජ්ජා විය යුතු වන්නේ කවර දේ පිළිබඳව ද යන්න තමන්ට ම වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකියි. මනුෂ්‍යයා තිරිසන් සත්වයාගෙන් වෙන්කොට හඳුනාගත හැක්කේ එසේ තේරුම්ගෙන ජීවිතයට සමීප කර ගන්නා උතුම් ගුණ ධර්ම නිසා ය.**

සිත දියුණු කිරීමට මනුෂ්‍යයා සමත්විය යුතු ය. එවිට හොඳ නරක, හරි - වැරැදි, යහපත - අයහපත, සභ්‍ය - අසභ්‍ය ආදී දේ වෙන් වෙන් වශයෙන් නිවැරදිව හඳුනා ගැනීමේ ශක්තිය ලැබේ.

ඈත අතීතයේ සිට මිනිසාගේ ශිෂ්ට බව රැකුණේ හිරි - ඔතප් නම් වූ ගුණ ධර්ම හේතුකොටගෙන ය. "හිරි" යනු වැරැදි දෙයක් කිරීමට ඇති ලජ්ජාවයි වැරැදි දෙයක් කිරීමට ඇති බිය "ඔත්තප්ප" වේ සියලු මිනිස් හැසිරීම් පාලනය වන්නේ මේ ගුණාංග දෙක මඟිනි.

ක්‍රෝධය, තණ්හාව, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථකාමී බව, ද්වේෂය මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, කාමආශා ආදී දුර්විපාකයන්ට ගොදුරු වූ මනුෂ්‍යයාගේ සිතේ සමබරතාව නැති වී යයි. එයින් සිදුවන්නේ තමන්ට උරුම වූ ශිෂ්ට බව අහිමි වී තිරිසන් සත්වයකුගේ තත්ත්වයට පත්වීමයි.

තිරිසන් සත්වයා ක්‍රියා කරන්නේ සදාචාරාත්මක ගුණධර්ම මඟින් නොවේ. ඔවුන් තුළ වන නොකැඩී පැවතීමට ඉවහල් වන සහජ ඉවෙන් ය.

මිනිසුන් තුළ ඇති ගතිගුණ විටෙක තිරිසන් සතුන් අතර පවා නොවන තරමට කනගාටුදායක වන්නේ ය. එවැනි හැසිරීම් රටා ඇති කර ගැනීම මනුෂ්‍යත්වයට නොගැළපෙන, අතර එයට කිසිදු අනුබලයක් නොදිය යුතු ය.

ගෞරවයට සුදුසු වන්නේ හිරි ඔතප් ඇති, කරුණාවන්ත, අන් අයට දයාවෙන් යුතු, අන් අයට හිරිහැර කිරීමට කැමැති නැති, නිරතුරුවම අන් අයට උපකාරවීමට කැමැති අයම පමණි.

මේ පොදු ගුණාංගය මනුෂ්‍යයන් නිරතුරුව ම ප්‍රගුණ කොට නොබිඳී ආරක්ෂා කළ යුතු ය. අන්‍යයන්ට පිහිටවීමෙන්, අන් අයට සේවය කිරීමෙන් මනුෂ්‍යයා තුළ තිබෙන සහජ වශයෙන්ම පවතින ගුණධර්ම දියුණු කොටගත හැකි ය. අන් අයට සේවය කිරීම, අන්‍යයන් පිළිබඳ අවබෝධය, දයාව, කරුණාව, අවංක බව, චාම් බව, මෘදු බව, නිහතමානී බව සන්තුෂ්ටිය ආදී ගුණ ප්‍රකට වේ. මනුෂ්‍යයා තුළ ඇති වන මෙවන් ගුණාංගයන්ගෙන් යුක්ත වීම මනුෂ්‍යයාගේ ආඩම්බරයට කරුණකි.

චරිත ලක්ෂණයන් අනුව කෙනකුගේ ස්වභාවය කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය. දේව ස්වභාවය, මනුෂ්‍ය ස්වභාවය හා තිරිසන් ස්වභාවය යනුවෙනි.

මේ චරිත ස්වභාවයන් මනුෂ්‍ය චර්යාවට විවිධ වූ මට්ටමින් බලපායි. තිරිසන් ලක්ෂණ පාලනය නොකොට ඒවා වැඩීමට ඉඩ ලබා දෙන්නේ නම් මනුෂ්‍යයා සමාජයට විශාල බරක් වන්නේ ය.

මේ ස්වභාවය පාලනය කිරීමට ආගම, ධර්මය බොහෝ ලෙසින් උපකාරී වෙයි. මනුෂ්‍යයාගේ, මනුෂ්‍ය ස්වභාවය ක්‍රමයෙන් වර්ධනය කිරීමෙන් අප තුළ ඇති දේව ස්වභාවය ලබා ගත හැකි ය. මේ දේව ස්වභාවය ඇති වූ විට තණ්හාව, ඊර්ෂ්‍යාව, ද්වේෂය, ක්‍රෝධය ආදී අයහපත් සිතිවිලි මුළුමනින් ම ඈත්ව යනු ඇත.

මේ ආකාර වූ අයහපත් සිතිවිලි ඈත් වීමෙන් මනුෂ්‍යයාගේ ගෞරවය, උදාරත්වය ලැබිය යුතු තැනට පත්වන්නේ ය.

මෙයින් පැහැදිලි වන්නේ ආගම දහම මඟින් මනුෂ්‍යයාගේ තිරිසන් ස්වභාවය පාලනය කොට, මිනිස් ස්වභාවය පෝෂණය කොට දේව ස්වභාවය ලබා ගත හැකි බව ය.

දේව ස්වභාවය රැඳී පවතින්නේ සුහදතාව, මිත්‍රත්වය, අන්‍යයන්ගේ යහපත උදෙසා කැපවීම, කරුණාව, මුදිතාව, අටලෝ දහමින් කම්පා නොවීම ආදී ගුණය මත ය.

උදාර මනුෂ්‍යයෙක් ලෙස ජීවත්වීමට නම්, මනුෂ්‍යයා විසින් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් රාශියක් ඇත. සියලු මනුෂ්‍යයන්ගේ යහපත උදෙසා කටයුතු කළ යුතුයි. සියලු අකුසල ප්‍රහාණය සඳහා කුසලයම ප්‍රගුණ කළ යුතුයි. සාමයෙන් සතුටින් ජීවත්වීම පිණිස දහම මඟින් අපට මඟ පෙන්වනු ලැබේ.

ඒ අන්‍යෝන්‍ය සහයෝගය, අන්‍යෝන්‍ය ගෞරවය හා අවබෝධයෙන් ජීවත්වීමට අවශ්‍ය මඟ පෙන්වීමයි. ඒ වගේ ම වෛර, ක්‍රෝධ, ඊර්ෂ්‍යා නොකර ජීවත්වීමට මනුෂ්‍යයාට හැකිවිය යුතු යි. ඒ සඳහා ධර්මයෙන් ඉගැන්වීම් සිදුකරනු ලැබේ. සිතීමේ ශක්තියෙන් පොහොසත් මනුෂ්‍යයාට බුදු දහම අනුගමනය කළ හැකි ය.

මනුෂ්‍ය ජීවිතයේ වටිනාම අංගයක් වන ආධ්‍යාත්මික ගුණ වර්ධනය අතපසු කළ යුතු නැත. මෙලොව සුබසිද්ධිය, සඳහා පරලොව සුබ සිද්ධිය, සඳහා නිර්වාණාවබෝධය සඳහා ධර්මය ම පිළිපැදීමෙන් මනුෂ්‍යයාට ශිෂ්ට බවට, උදාර බවට පත්විය හැකි ය.

දීපා පෙරේරා

# පමා වූ අය ම මරු වසඟයට යති



## නිවාප සූත්‍රය

**නිවාප යනු තෘණ විශේෂයකි. එම තෘණ උපමා කොට දේශනා කළ සූත්‍රය නිවාප සූත්‍රයයි.**

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි එක් සමයක භික්ෂූන් වහන්සේ අමතා මේ දේශනය කළ සේක.

මහණෙනි, එක්තරා මුව වැද්දෙක් සිටී. හේ මුව සමූහයාගේ වඩා කැමැති නිවාප නම් තෘණ විශේෂයක් මුවන්ට ගොදුරු පිණිස වපුරයි. නේවාපික වැද්දා ( නිවාප වවන තැනැත්තා) මේ තණ වපුරන්නේ "මා විසින් වපුළ මේ ගොදුරු තණ අනුභව කරන මුව සමූහයෝ දීර්ඝායුෂ වෙත්වා. පැහැපත් වෙත්වා. බොහෝ කලක් සැප සේ වෙසෙත්වා" යන අදහසින් නොවේ. ඔහු මේ තණ වවන්නේ තෘණ කෙතට වදින මුව සමූහයෝ ආශාවෙන් මුළා වී තණ කා මත් වී සිහි නැතුව වැටී සිටින විට මගේ කැමැත්තක් කළ හැකි වන්නේ ය යන සිතිවිල්ලෙනි.

මහණෙනි, ඒ මුව සමූහයන් අතර පළමු වැනි මුව සමූහයෝ නේවාපිකයා වැපිරූ තණ කෙතට වැද ආශාවෙන් මුසපත්ව තණ කෑවෝය. තණ කෑ ඔවුහු සිහි නැති වූහ. නේවාපික වැද්දාගේ වසඟයට පත්වූහ.

මහණෙනි, මෙහි දෙවැනි මුව සමූහයෝ මෙසේ සිතූහ "නේවාපිකගේ තණ කොටුවට ගිය පළමු කණ්ඩායම තණ කා මුව වැද්දාගේ වසඟයට ගියහ. අපි එසේ නොවෙමු. නිවාප භෝජනයෙන් වැළකී කැලයේ යමක් බුදිමින් කැලයට ම වී වාසය කරන්නෙමු නම් යෙහෙකි යි කියා ය. මෙසේ සිතූ ඔවුහු නිවාප භෝජනයෙන් සම්පූර්ණයෙන් වැළකී කැලයට ම වී වාසය කළහ.

ගිම්හානයේ අවසාන මාසය උදා විය. වනයේ ජලය සිඳී තණ වියළී ගියේ ය. ආහාර හිඟ වූ මුවන්ගේ ශරීරය කෙට්ටු වී ශක්තිය පිරිහුණේ ය. නේවාපිකගේ තණ කොටුවට වැද ( දෙවන මුවරැල ද) තණ කා මුසපත්ව සිහි නැතිව ඇද වැටුණි. නේවාපිකට ඔවුන් ද ගොදුරු කර ගැනීමට, වසඟ කර ගැනීමට හැකි විය.

මහණෙනි, තුන්වැනි මුව සමූහයක් වෙති. ඔවුහු මෙසේ සිතූහ. පළමු මුව සමූහය නේවාපිකගෙන් නොමිදුණහ. දෙවැනි මුව සමූහය ද එය දැන වනයට වී සිට ගිම්හානයේ අවසාන මාසයේ දී ආහාර හිඟ වී මුව වැද්දාගේ තණ කොටුවට වැද ආශාවෙන් මුළාව තණ කා සිහිසුන්ව ප්‍රමාදයෙන් වැද්දාට ගොදුරු විය. එහෙයින් අපි තණ කොටුව අසලින් ළඟින තැනක් පිළියෙල කරගෙන තණ කොටුවට නො වැද, මුසපත් නොවී තණ කන්නෙමු ය. මත් නොවූවෝ සිහි මුළාවට නොපැමිණෙයි. මෙසේ ඔවුන් එහි නො වැද, මුසපත් නොවී තණ කන්නාහුමත් නොවූහ. මත් නොවීම නිසාම සිහි මුලාවට පත් නොවූහ. එහෙයින්ම නේවාපිකට කැමැත්තක් කළ නොහැකි විය.

මහණෙනි එහි දී මුව වැද්දාටත්, ඔහුගේ පිරිසටත් මෙවැනි අදහසක් විය. මේ තුන්වැනි මුව සමූහය නම් හරිම කපටියෝ ය. යක්ෂයෝ ය. ඍද්ධිමතුන් (කැමැති දේ කරන්නෝ) වැනි ය. මොවුන් වපුරා ඇති තණ ද කති. එන යන මඟකුදු පෙනෙන්නට නැත. එනිසා අපි මේ වපුල තණ කොටුව වටා මහත්වූ ප්‍රදේශයක් අල්ලා වට කරමු. වැට බඳිමු" කියායි. එසේම දඬු සිටවූවා වරදැලින් හාත් පස මහත් කොටසක් වට කළාහු ය. එහි දී මුව සමූහයෝ ළඟින තැන් දුටුවා හු ය. මෙසේ තුන්වැනි මුව රළ ද මුව වැද්දදාගෙන් මිදුණේ නැත.

මහණෙනි, සතරවන මුව සමූහයක් ද වෙති. ඔවුන් මෙසේ කල්පනා කරන්නට විය. පළමුවන සමූහය තණ්හාව නිසා මුසපත්ව, සිහිමුළාව මුව වැද්දාට ගොදුරු විය.

දෙවැනි මුව සමූහයෝ ද මඳ කලක් නිවාප භෝජනයෙන් වැළකී සිට අනතුරුව තණ්හාව මුල්වී මුව වැද්දාට ගොදුරු වූවෝ ය.

ඒ තෙවන මුව සමූහය කලක් නිවාප ආහාරය මුව වැද්දාට හසු නොවන පරිදි භුක්ති වින්දහ. අවසානයේ දී විනාශයට පත්වූහ කියා ය.

එසේ හෙයින් මුව වැද්දා හෝ මුව වැද්දාගේ පිරිස හෝ යා නොහැකි තැනක් වාසස්ථානය වශයෙන් තෝරා ගෙන නිවාප තණ කොටුවට ඇතුළු නොවීම ගොදුරු කා ඒවාට ආශා නොකර තණ කා මත් නොවී, මත් නොවීම නිසා සිහිමුළා නොවීම, ඔවුන්ගේ ග්‍රහණයෙන් අප මිදින්නෙමු ය'යි කල්පනා කරමින් ඒ අනුව ක්‍රියා කොට නේවාපිකගේ ග්‍රහණයෙන් ද මිදුණහ. නේවාපිකට කැමති සේ කටයුතු කළ නොහැකි විය.

මහණෙනි, මෙහිදී නේවාපිකටත්, නේවාපිකගේ පිරිසටත් මේ අදහස විය. මේ ඒ සතරවැනි මුව සමූහය ඉතා කපටියෝ ය. හික්මුණු කෛරාටිකයෝ ය. යක්කු ය. ඍද්ධිමතුන් වැනි ය. වපුරන ලද මේ තණකොටුව ද කති. ඔවුන් යෑම් – ඊම් තැනක් දැකිය නොහැකි ය. සතරවැනි මුව සමූහය ළඟින තැන ඔවුහු නොදුටුහු ය. මහණෙනි, මෙහිදී නේවාපිකට ද, නේවාපික පිරිසට ද මේ අදහස විය.

අපි මේ සතරවැනි මුවරළ සොයා කලබල කළහොත් ඒ අනුව අනෙක් මුවෝ ද පලා යන්නාහුය. එසේ වුවහොත් මුව සමූහයෝ මේ වපුළා වූ තණ ද කති. තණ කොටුව ද හිස් කරති. අපි සතරවැනි මුව සමූහයා කෙරෙහි මධ්‍යස්ථ වෙමු යි කියා යි.

මහණෙනි, මෙසේ සතරවැනි මුව සමූහයා කෙරෙහි නේවාපික හා නේවාපික පිරිස මැදහත් වූහ. එහෙයින්ම ඔවුහු තණ ද කති. නේවාපිකගේ ග්‍රහණයෙන් මිදුණාහ.

මහණෙනි, මා විසින් මේ උපමාව ගෙනහැර දැක්වූයේ මේ අර්ථය හැඟවීම් පිණිස ය. මහණෙනි, "නිවාප" යනු පස්කම් ගුණයට නමෙකි. "නේවාපික" (මුව වැද්දා) යනු පාපිෂ්ඨ මාරයාට නමෙකි. "නේවාපික පිරිස" යනු මාර පිරිසට නමෙකි. මුව සමූහය යනු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට නමෙකි. මහණෙනි, පළ මුවැනි ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස මාරයා විසින් වපුළ ඒ තණ කොටුව ( නිවාප) නම් වූ පඤ්චකාමයන් කෙරෙහි තණ්හා වූහ. ඒවාට ගොදුරුව, මුසපත්ව, සිහි නැතිව ප්‍රමාදයට පත් වූහ. (ලෞකික සැප සම්පත්හි ගිජු වූ මේ අය පළමු මුව පිරිස මුව වැද්දාට ගොදුරු වූවා සේ මාරයාගේ වසඟයට යති.

මහණෙනි, එහි දී දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස, පළමුවැනි, ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස පඤ්චකාම ගුණයන්හි ඇලීමෙන් මරු වසඟයට ගිය බව දැන පඤ්චකාම නමැති ලෞකික ආශාවන්ගෙන් හැම අතින්ම වෙන් වෙමු යැයි ද, එම පරිභෝජනයන්ගෙන් වෙන් වූ අපි වනයට වැද වාසය කරන්නෙමු නම් මැනැවයි කියා සිතූහ. එසේ සිතූ ඔවුහු භයජනක පඤ්චකාම පරිභෝගයන්ගෙන් වෙන්ව ම වනයට වැද පලා ද, ඵල ද, සම් කෑලි, ගස්, ලාටු, වන මුල්, ස්වයංපති ඵල යනාදිය අනුභව කරමින් ශ්‍රමණ බව රකිමින් කය පවත්වා ගෙන ගියහ.

ග්‍රීෂ්ම සාර මාසයෙහි අන්තිම මාසය වනයෙහි තණ ද, පල ද, දිය ද නැති වී ගියේය. එවිට ඔවුන්ගේ ශරීරය ඉතා කෘශ විය. ශරීර ශක්තිය ද පිරිහුණේ ය. මෙසේ ශරීරය පිරිහුණු කල් වනයෙහි වසමු'යි යන අදහමස ද පිරිහුණේ ය. නගරයට ආහ. චිත්ත විමුක්තිය පිරිහුණු කල්හි මාරයා විසින් වපුළ තණ කොටුව වැනි ඒ පඤ්චකාම ගුණයන් පරිභෝජනයට පටන් ගත්හ. ඔවුහු එහි වැද මුසපත්ව පස්කම් බොජුන් අනුභව කළහ. එසේ අනුභව කරන්නාහු මදයටත් – ප්‍රමාදයටත් පත්ව සිහි නැති බවට පත්වූහ. සිහි නැති වූයේ මේ මාරයාගේ තණ කොටුව වූ පඤ්චකාම ගුණිත නිවාපයෙහි (තණ කොටුවේ ලැග්ගවුන් වැනි) මාරයා කැමති සේ කළ යුත්තන් බවට පැමිණියහ. මාරයාගේ වසඟයට ගියහ. මේ දෙවැනි මුව සමූහයා සේ දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයන් ද එබඳු උපමා ඇත්තවුන් යැයි කියමි.

**ඉතිරිය 06 පිටුවට ...**

ත්‍රිපිටක පරිවර්තන
මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු
දෙපාර්තමේන්තුව
බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**



## පමා වූ අයම ...

05 පිටුවෙන් ...

මහණෙනි, මෙහිදී තුන්වැනි මහණ බමුණෝ මෙසේ සිතූහ. පළමුවැනි මහණ බමුණෝ මාරයා විසින් වපුළ පඤ්චකාම ගුණ නමැති ලෞකික ආමිසයන්හි ඇලී මාරයාගේ වසඟයට ගොදුරු වූහ.

තව ද ඒ දෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පළමු මහණ බමුණන් ලෝකාමිසයට ගිජුව මහණ දම් ඵල නොලබා මරුහුගේ ගොදුරු බවට පත්වූහයි දැන,ලෞකික ආමිෂයන්ගෙන් බැහැරව වනවාසීව මහණදම් පිරූහ. එහෙත් ඔවුන් ද කලක් වනෙහි වාසය කොට "වනෙහි වසමු" යි යන අදහස පිරිහුණේ ය.

මෙසේ චිත්ත විමුක්තිය, චිත්ත ධෛර්යය පිරිහුණු කල්හි මාරයා විසින් වපුළ තණ කොටුව නම් පඤ්චකාමයන්ට ගොදුරු වූහ. එහෙයින් තෙවැනි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද නේවාපිකගේ (මුව වැද්දාගේ) තණ කොටුවට දෙවැනි වර ඇතුල් වූ මුව සමූහය සේ මුව වැද්දාට ගොදුරු විය. මාරයාගේ වසඟයට ගියහ කියා සිතන්නට විය. එසේ හෙයින් අපි ලෝකාමිසය ද අනුභව කරමු. එහෙත් එහි නොලැග මුසපත් නොවී බුදින්නෙමු. එයින් මත් නොවූවාහු වෙත්. සිහි නැති බවට නො පැමිණියාහු වෙත්. ඒ නොපමාව හේතු කොටගෙන මාරයාගේ නිවාපය වූ ලෝකාමිසයෙහි කැමැති සේ කටයුතු නොකළහ. එනිසාම මාරයා විසිනිදු කැමැති සේ කටයුතු නොවූහ. එතෙකුදු වුවත් මේ තුන්වැනි මහණ බමුණු සමූහය දෘෂ්ටි ඇත්තෝ වූහ. ලෝකය ශාස්වතය, ලෝකය අශාස්වත ය. ලෝකය කෙළවරක් ඇත්තේ ය. කෙළවරක් නැත්තේ ය. ජීවය හා ශරීරය එකකි. ජීවය අනෙකෙකි. ශරීරය අනෙකකි. සත්ත්වයා මරණින් මතු වන්නේ ය. සත්ත්වයා මරණින් මතු නොවන්නේ ය. සත්ත්වයා මරණින් මතු වන්නේත් වේ. නොවන්නේත් වේ. සත්ත්වයා මරණින් මතු නොවන්නේත් නොවේ යනාදි වශයෙන් දෘෂ්ටි ඇත්තෝ වූහ.

මහණෙනි, මේ තුන්වැනි මහණ බමුණු සමූහයා දෘෂ්ටි ගතවීම හේතු කොට තුන්වැනි මුව සමූහය මුව වැද්දා විසින් ඉතා විශාල ප්‍රමාණයක් දැව දඬු වටකොට ආරක්ෂක ස්ථානයන්හි ලැග සිට මුව සමූහය අල්ලා ගත්තා සේ මාරයාගේ වසඟයට ගියහ. එයින් නොමිදුණහ.

මහණෙනි එහිදී සතරවැනි ශ්‍රමණ බමුණෝ පිරිස මෙසේ සිතූහ. පළමුවන මහණ බමුණෝ පඤ්චකාම ගුණයන්හි ආසා කොට පස්කම් බොජුන් වළඳමින් මාරයාගේ වසඟයට ගියහ. දෙවැනි මහණ බමුණෝ ද පඤ්චකාම ගුණයන් හි කලෙකට වෙන්ව පසුව පස්කම් බොජුන් වළඳා මරුවාගේ වසඟයට ගියහ. තුන්වැනි මහණ බමුණෝ ද පඤ්චකාම ගුණයන්ගෙන් මිදී පස්කම් බොජුන් වළඳමින් අප්‍රමාදී වීම නිසා මාරයා විසිනිදු කැමැති සේ කටයුතු කළ නොහැකි විය. එහෙත් ඔවුනුදු වැරැදි ලෙස දෘෂ්ටිගත වීම නිසා මාරයාගේ වසඟයට ගියහ.

එසේ හෙයින් අපි මාරයා විසින් වපුළ නිවාපය වූ පඤ්චකාම ගුණයන්ට නොවැද, මුසපත් නොවී, පස්කම් බොජුන් අනුභව කරන්නෝ වෙමු. මත් නොවන්නෝ වෙමු. මත් වූවෝ නොවෙමු. සිහි ඇත්තෝ වෙමු. එහෙයින්ම මාරයා කැමැති සේ කළ යුත්තෝ නො වන්නෙමු කියා සිතූහ.

මෙසේ සිතූ මෙම ශ්‍රමණ බමුණෝ යම් තැනක මාරයාගේත්, මාරයාගේ පිරිසෙහිත් ගමන් නැත් ද එවැනි ආරක්ෂක ස්ථානයක් ඇති කළහ. එහි සිට ලෝකාමිසයන්ට නොවැද, මුසපත් නොවී, පස්කම් (පඤ්චකාම) බොජුන් අනුභව කළහ. ඔවුහු එහි නොවැද, නොමුසපත්ව, පස්කම් බොජුන් අනුභව කරන්නාහු මත් නොවූහ. සිහිනැති බවට නොපැමිණියහ. එහෙයින්ම මාරයා විසින් කැමැති සේ කළ යුත්තේ නොවන ස්වභාවයට පත්වූහ.

සතරවැනි මුව සමූහය මුව වැද්දාගෙන් මිදුණේ යම් සේ ද, මේ සතරවැනි මහණ බමුණෝ ද මාරයාගේ කැමැත්තට කටයුතු කළ යුත්තේ නො වූහ.(මිහිරි බොජුන්, අගනා සෙනසුන් විහරණය කළ ද ඒවායේ නො ඇලුණාහ)

මහණෙනි, මාරයාගේත්, මාර පිරිසගේත්, ගති නොමැති (අගතිය ) තැන් කෙසේද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව, අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත, විචාර සහිත, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ තෙමේ මාරයා අන්ධ කළේ යැයි ද මාරයාගේ ඇස නැසුවේ යැයි ද, මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි, තවද තැනෙකි, මේ ශාසනයෙහි මහණ තෙමේ විතක්ක - විචාරයන් සන්සිඳවීමෙන්, ආධ්‍යාත්මයෙහි මනා පැහැදීම ඇති කරන්නා වූ විතක්ක - විචාර රහිත සිතේ එකඟ බව ඇති සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති දෙවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි.

මහණෙනි, මේ මහණ තෙමේ ද මාරයා අන්ධ කෙළේ යැයි ද, මරු ඇස, නැසුවේ යැයි ද පවිටු මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි තවද තැනෙකි. මහණ තෙමේ ප්‍රීතියෙන් ද වෙන් වීමෙන් මැදහත් බව (උපේක්ෂා) ඇත්තේ, සිහි ඇත්තේ මනා නුවණින් යුක්තව වාසය කරයි. කයින්ද සැපයක් විඳියි. ආර්යයෝ යම් ඒ ධ්‍යානයක් උදෙසා සැප දුක් දෙකට මැදිහත් (උපේක්ෂා) විඳීම ඇත්තේ ය. සිහි ඇත්තේ ය. සැපයෙන් විසීම ඇත්තේ ය. යනුවෙන් ගුණ වර්ණනා වශයෙන් කියන තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි.

මහණෙනි, මේ මහණ තෙමේ මාරයා අන්ධ කළේ යැයි ද මරු ඇස නැසුවේ යැයි ද, පවිටු මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි, අනෙකෙක් ද වෙයි. මහණ තෙමේ සැපත් පහවීමෙන්, දුකත් පහවීමෙන්, පළමුව සොම්නස් දොම්නස් දුරුවීමෙන් දුක් නැති සැප නැති උපේක්ෂාව හා සිහිය පිළිබඳ පිරිසුදු බව ඇති හතරවැනි ධ්‍යානයට (කුසල චිත්තයට) පැමිණ වාසය කෙරෙයි.

මහණෙනි, මේ මහණ තෙමේ ද මාරයා අන්ධ කෙළේ යැයි ද, මරු ඇස නැසුවේ යැයි ද, පවිටු මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි, අනෙකක් ද වෙයි. මහණ තෙමේ හැම ලෙසින් ම රූප සංඥාවන් ඉක්මවීමෙන්, ප්‍රතිඝ (තරහ) සංඥාවන් අස්තංගත කිරීමෙන් නානාත්ව සංඥා වාසය කෙරෙයි. මේ මහණ තෙමේ මාරයා අන්ධ කෙළ් යැයි ද මරු ඇස නැසුවේ යැයි ද, පවිටු මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි, නැවත ද අනෙකක් වෙයි. මහණ තෙමේ හැම ලෙසින්ම ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතනය අනන්ත යැයි විඤ්ඤාණඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ මාරයා අන්ධ කළේ යැයි ද, මරු ඇස නැසුවේ යැයි ද, මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි, අනෙකෙක් ද වෙයි. මහණ තෙමේ හැම ලෙසින්ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත් නැතැයි අරමුණ වශයෙන් ගෙන ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි,මේ මහණ මාරයා අන්ධ කෙළේ ය. මරු ඇස නැසුවේ ය. මාරයාගේ නොදැක්මට ගියේ යයි ද කියනු ලැබේ.

මහණෙනි නැවත ද අනෙකක් වෙයි. මේ මහණ තෙමේ හැම ලෙසින් ම ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ මහණ මාරයා අන්ධ කෙළේ ය. මරු ඇස නැසුවේ මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද කියනු ලැබේ.

මහණෙනි අනෙකක් ද වෙයි. මේ මහණ තෙමේ හැම ලෙසින් ම නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධ උපදවා ගනී. එයට පැමිණ වාසය කරයි. ඔහු විසින් මාර්ග ප්‍රඥාවෙන් චතුරාර්ය සත්‍යයන් දැක ආශ්‍රවයන් ක්ෂය කරන ලද්දාහු වෙති. මහණෙනි,මේ මහණ මාරයා අන්ධ කළේ යැයි ද, මරු ඇස නැසුවේ යැයි ද මාරයාගේ නොදැක්මට ගියේ යැයි ද, ලෝකයෙහි "විසත්තිකා" නම් වූ තෘෂ්ණාව තරණය කළේ යැයි ද කියනු ලැබේ.

භාග්‍යවතුන් වහන්සේගේ මේ දේශනාව අසා ඒ භික්ෂූන් වහන්සේ සතුටු වූහ. දේශනාව පිළිගත්හ.

### නිවාප තෘණ

නියඟය වේ ද එහිදී ද ඒක සනව වැඩෙයි. වැද්දෝ එක් දිය ඇති තැනක මේ තණ ඉස වපුරා වැටක් බැඳ දොරවල් යොදා මේවා රකිති. යම් කලෙක මහා නියඟය වේ ද සියලු අවට තණ වියළුණේ වේ ද, දිව තෙමෙන පමණකුදු ජලය දුර්ලභ වේ ද, එවිට මෘග සමූහයෝ වියළි තණ ද, පරඬැල් ද කමින් වෙවුලමින් මෙන් හැසිරෙන්නා හු නිවාප තෘණයන්හි ගඳ ආඝ්‍රාණය කොට වද බන්ධනාදිය නොසලකා වැට මඬිමින් කොටුවට පිවිසෙති. ඒ ඔවුනට නිවාප තෘණ අතිශයින් ප්‍රිය මනාප හෙයිනි.

නේවාපික තෙම (මුව වැද්දා) ඔවුන් දැක දෙතුන් දිනක් නොදැක්කකු මෙන් හැසිරෙයි. මේ නිවාප වපුරා ඇති තැන්හි තැන් තැන්වල දිය වළවල් ද වෙති. මේ මෘගයෝ විවරව ඇති දොරින් පිවිස පළමු දින කෑ පමණින් ම බිවි පමණින් ම පැන යෙති. දෙවැනි දවස කිසිවක් නොකෙරෙතැයි සිතා කන් සලමින් කා බී වෙලාව ද ගත කරෙති. ඊළඟ දවස කිසිවකුගෙන් කරදරයක් නැතැයි යැපෙන තාක් කා බී මඩුලු ලැහැබකට පිවිස නිදති. වැද්දා මේ වන විට ඔවුන්ගේ ප්‍රමාදය දැක දොර වසා හාත්පසින් ම වට කොට කෙළවර පටන් කොටමින් යයි. මෙසේ ඔවුහු තණ කොටුවෙහි මුව වැද්දා විසින් කැමැති සේ කළ යුත්තේ වෙති.

පවිටු මාරයා බීජයන් මෙන් පස්කම් ගුණ වපුරමින් නො ඇවිදියි. එහෙත් මේ කාම ගුණයන් හි ගිජු වූවන්ගේ ප්‍රභූත්වය පවත්වයි. එහෙයින් කාම ගුණයෝ මාරයාගේ නිවාපයෝ නම් වෙති.

අගතිය – ගතිය නැත්තේ අගතියයි

විතර්ක – කුසල් අරමුණෙහි සිත පිහිටුවීම

විචාර – ඒ අරමුණෙහි නැවැත නැවැත යෙදී සිත හැසිරීම.

ප්‍රීති – එක් අරමුණක සිත හැසිරීම නිසා සිතෙහි විවේකයෙන් හටගන්නා ප්‍රීතිය

සැප – සිතේ ඇති වන ප්‍රීතිය නිසාම කයට දැනෙන සැහැල්ලු ස්වභාවය මෙය සැපය යි.

ඒකග්ගතා කුසල චිත්තය තමා තුළ උපදවාගෙන වාසය කිරීම, විදර්ශනා පාදක මේ සිත මාරයාට දැකිය නොහැක.

මාරයා අන්ධ කිරීම – ධ්‍යානය විදර්ශනා පාදකකොට යෝගාවචරයාගේ සිත මේ නම් අරමුණක් හි (කුසල් චිත්තයක) පවතී යැයි මාරයාට දැකිය නොහැකි නිසා, ඒ විදර්ශනා පාදක ධ්‍යානයට සම වන භික්ෂුව මාරයා අන්ධ කළේ යැයි වදාළ සේක.

(අටුවාව ඇසුරෙනි)

---

# අනලස්බව සතුට ගෙන එයි

දෙලොව දියුණුව සාධනයෙහි ලා මුලින්ම මෙලොව අභිවෘද්ධියට පුද්ගලයා කාර්යශූර දක්ෂයකු විය යුතු ය. නිවන් මඟට ද, මෙලොව දියුණුවට ද දක්ෂ බව එකසේ වැදගත් වෙයි. නිවන් මඟ වඩනු කැමැති තැනැත්තාට ඒ සඳහා මඟ කියාදුන් කරණීය මෙත්ත සූත්‍රයේ සක්කෝ යනුවෙන් දක්වනුයේ දක්ෂ බවයි.

හිත ඇත්නම් පත කුඩා ද ගැම්වහරින් කියවෙන්නේ උත්සාහය උනන්දුව ඇති අයකුට කළ නොහැකි කාර්යයක් නොමැති බවයි. පළමු පියවර ඔබේ ජීවිතයෙන් අරඹන්න. එවිට ඔබේ පවුල් සංස්ථාව දිනෙන් දිනම දියුණු වේ. ජය කණුව වෙත ම ධාවනය වෙයි. මනා කළමනාකරණය පුද්ගල ජීවිතයට ද, ඔබ පවුලට ද දියුණුව උදෙසා අත්‍යවශ්‍ය ය. නිසි කළමනාකරණය, කාර්යක්ෂමතාව, ඉතිරිකිරීම් ආයෝජනය නිසි අයුරින් යෙද වූ විට අධීක්ෂණය යහපත් නම් බලා සිටිය දී ඔබ මුදලින් වස්තුවෙන් දියුණු වේවි.

අලසකම කුසීතකම මඟහැර උදෑසනින් අවදි වී දවසේ කටයුතු හොඳින් සැලසුම් කර දියුණුව උදෙසාම ක්‍රියා කළ යුතු ය. ගිහි හෝ පැවිදි හෝ වේවා ඒ කුමන පක්ෂයට අයත් වුව ද තම අභිමතාර්ථ සාධනයෙහිලා පුද්ගලයා වෙර වීර්යය යෙදිය යුතු ම ය. මෙලොව දියුණුව උදෙසා කම්මැලිකම, හැරපියා උදේ අවදි වූ තැන් පටන් ලෞකික සම්පත් වර්ධනයෙහිලා බුද්ධිමත් තැනැත්තා උත්සුක වෙයි. පවුලේ ආර්ථික සුරක්ෂිත බව ඇතිකර ගැනීම භව භෝග රැස්කර ගැනීම, නුවණැත්තාගේ සිරිත යි. එහෙයින් තමාගේ සම්පත් දැක සම්පත් ඇතැයි යන සතුට ගිහියාට දැනේ.

---

ශාස්ත්‍රපති
**රාස්සගල චන්දකිත්ති හිමි**



# ගුණදම් වැඩූ පිනැතියන්ගේ සිත වෛරී සිතිවිලි වැඩෙන්නේ නැත

**කොසොල් රටේ වාසය කළ එක්තරා පවුලක තරුණයෙක් බුදු සසුනේ පැවිදි ව, උපසම්පදු ලැබ තිස්ස තෙරුන් වහන්සේ ලෙස ප්‍රසිද්ධ වුණා. වැසි සමය උදා වූ කාලයේ ඒ ගමේ උපාසකයකුගේ ඇරැයුම ලැබ තිස්ස හිමියෝ වස් විසුවා.**

වස් අවසානයේ දී ඒ උපාසක සිවුරු පිරිකර ද, තෙල්, මී පැණි, සකුරු ආදිය ද රැගෙන තෙරුන් වහන්සේ දැකීමට පැමිණියා. "උපාසක මේ කවර හේතුවකට ද?"

"ස්වාමීන් වහන්ස, අපගේ විහාරයේ වස් වසන තෙරුන් වහන්සේට අප මෙසේ චීවර ආදී පූජා භාණ්ඩ පිරිනමනවා. එනිසා ඔබ වහන්සේ මේ පූජාව පිළිගන්නා සේක්වා"

"උපාසක මෙවැනි පූජා භාණ්ඩවලින් අපට එලක් නැහැ. මට ගෝල නමකුත් නැහැ. ඒ නිසා මේ පිරිකර , තෙල්, මී පැණි, සකුරු ආදිය මට ප්‍රයෝජනයක් නැහැ."

තිස්ස තෙරුන් වහන්සේගේ ඒ වදන ඇසූ ඒ උපාසක තම සත් හැවිරිදි පුත්‍රයා කැඳවාගෙන පැමිණ මහණ කර ගන්නා ලෙස දන්වා තෙරුන් වහන්සේට බාර කළා. කුඩා දරුවාගේ හිස කෙස් තෙමා ඔහුට කමටහන් උගන්වා තෙරුන් වහන්සේ ඔහුගේ කෙස් බූ ගාන්නට වුණා. දැලි පිහිය හිස මත තබා බූ ගෑම අවසන් වෙත්ම ඒ කුඩා දරුවා අරහත්වයට පත් වුණා. ඒ බව නො දත් තිස්ස තෙරුන් ඔහු පැවිදි කරවූවා. පසුව බණ දහම් කියා දී පැවිදි ව පෝය දෙකක් ගෙවීමෙන් පසු තෙරුන් වහන්සේ කුඩා සාමණේරයන් වහන්සේ ද කැටුව බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට පිටත් වුණා.

ගමනාන්තය ඉතා දිගුයි. ඒ නිසා අතරමඟ තිබූ විහාරයක උන්වහන්සේ නවාතැන් ගත්තා. කුඩා සාමණේරයන් වහන්සේ වහ වහා තමන් වහන්සේගේ ගුරු හිමියන්ට ලැගුම් ගැනීමට ස්ථානයක් පිළියෙළ කර වූවා. එය නිම කරද්දී රෑ බෝ වූවා. සාමණේරයන්හට ලැගුම් පිණිස කුටියක් පිළියෙළ කර ගැනීමට නොහැකි වූවා. තම ගෝල නමට කුටියක් නොමැති බව දුටු ලොකු තෙරුන් වහන්සේ "පොඩි නම මේ ස්ථානය අපට නුපුරුදු ස්ථානයක්. ඔබට සැතපෙන්න ස්ථානයක් නැති නිසා මගේ කුටියේ ඔබත් සැතපෙන්න" කියා උන්වහන්සේ නින්දට ගියා.

සාමණේරයන් වහන්සේට සිතුණා " මගේ ගුරු හිමියන් සමඟ රෑ තුනක් එකම ලැගුම් ගෙයි සැතපුණොත් එය වැරැද්දක් වෙනවා. එනිසා මම උන්වහන්සේ අසල සැතපෙන්නේ නැතිව එරමිණිය ගොතාගෙන වැඩ සිටිනවා" සිතා කුඩා හිමියෝ අලුයම දක්වා නිදි වර්ජිතව සිටියා. නින්දෙන් පිබිදුණු තිස්ස මහ තෙරුන් වහන්සේ ගෝල හිමියන් සමඟ එකම ලැගුම් ගෙයි සැතපීම ඇවැතක් බව සිහි වී කලබලයට පත්ව, අසල තිබූ වටාපත අතට ගෙන එහි මිටෙන් ඇන කුඩා හිමියන් අවදි කරන්නට සිතුවා.

අඩ අඳුරේ වටාපතෙහි මිටෙන් ඇන" ආයුෂ්මතුනි වහා එළියට වඩින්න" සාමණේරයන් වහන්සේට කියා සිටියා. අවාසනාවකට මෙන් ඒ වටාපතෙහි මිට වාඩි වී සිටි කුඩා හිමියන්ගේ ඇසෙහි ඇනීමෙන් ඇස තුවාල වුණා.

කුඩා හිමියෝ ද තමාගේ ඇස තුවාල වූ බව නො කියා වහා කුටියෙන් බැහැරට වැඩියා. ගුරු ගෞරවය මැනවින් දැන සිටි සාමණේර හිමියෝ වේදනාව යටපත් කොට ගෙන ඉදල රැගෙන ගොස් මිදුල පිස දමා දැහැටි හා මුව සේදීමට ජලය ද සපයා තැබුවා. පසුව ගුරු හිමියෝ කැඳවාගෙන විත්, දැහැටි ආදිය එක අතකින් පිරිනැමුවා.

දැහැටි, පැන් එක අතකින් පිරිනමන්නේ තමාට ගෞරවයක් නැතිව බව සිතූ තිස්ස හිමියෝ

"ආයුෂ්මතුනි, දෙන යමක් වේ නම් ගුරුවරයාට" දෑතින්ම නො දෙන්නේ මන්ද?" කියා විමසුවා.

එවිට කුඩා හිමියෝ තමාගේ ඇස තුවාල වූ ආකාරයත්, එහි වේදනාව නිසා එක් අතකින් ඇස වසාගෙන දැහැටි ආදිය පිළිගැන්වූ බවත් පැවසුවා. තමා අතින් සිදු වූ වරද වහා වටහා ගත් තිස්ස තෙරණුවෝ වහා සත් හැවිදිරි ඒ සාමණේරයන් වහන්සේ ළඟ දනින් වැටී සමාව ගත්තා. ඒ කුඩා හිමියන් පැවිද්ද අනුව බාල වුවත් ගුණගරුක භාවයෙන් වැඩී සිටි බැවින්, තිස්ස තෙරුන් වහන්සේ එසේ කිරීම නොකටයුත්තක් වූයේ නැහැ.

"ඔබ වහන්සේ සිත් කම්පා කර ගත යුතු නැහැ. මේ මා පෙර කළ අකුසල කර්මයක් වෙන්න ඇති කියා සාමණේර හිමියෝ ගුරු හිමියන් සැනසීමට වෙර දැරුවා. දෙනම ම සිවුරු පාත්‍රා ගෙන බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට වැඩියා. බොහෝ සේ සිත් තැවුලට පත් ගුරු හිමියෝ බුදුරදුන් අබියස මෙසේ කියා සිටියා.

"ස්වාමීනි, මේ තරම් ගුණ යහපත් ගෝල නමක් මා දැක නැහැ. මගෙන් වූ වරදට උන්වහන්සේ පවසන්නේ තමාගේ පෙර අකුසලයක් බවයි. එය මට මහත් සිත් වේදනාවක්" එවිට භාග්‍යවතුන් වහන්සේ වදාළා.

"පින්වත් තිස්ස, මේ කුඩා සාමණේරයන් සියලු කෙලෙස් නසා අරහත්වයට පත් වූ කෙනෙක්. එවැන්නකුගේ සිතේ වෛරය රැඳෙන්නේ නැහැ. මුසාවාදය, ප්‍රාණඝාතය නොමැති හෙයින් සංසිඳුණු සිත් ඇතිව උන්වහන්සේ වාසය කරනවා. සිත,කය, වචනය යන තිදොරින් කිසිදු පවක් නො කරන රහත් උතුමකු කිසිදු දිනක වෛර කිරීම ආදිය සිදු නො කරයි යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා. බුදුන් වහන්සේගෙන් දහම් ඇසූ කොසැඹෑනුවර තිස්ස තෙරණුවෝ ද උතුම් අරහත්බවට පත් වූවා.

# සීලයේ අසිරිය

**ජීවිතයට වටිනාම ආරක්ෂාව සීලයයි. සීලය නම් වූ ආරක්ෂාව නැත්නම් සැබවින් ම අපි අනාරක්ෂිත යි.**

අන් අය සුවපත් කරන වෛද්‍යවරයකු වූවත් සීලය තමාගේ ජීවිතයට ගලපාගෙන නැත්නම්, ඔහු තමාගේ ජීවිතයේ සුවය හදාගෙන නැහැ. අපි මේ ලෝකයේ කුමන දේ ගොඩනැඟුවත් සිල්වත් ජීවිතයක් ගොඩනඟා ගෙන නැත්නම් අපි අනාරක්ෂිත යි. මේ ජීවන රඟ මඬලේ සීලය අපට ගලපා ගන්න බැරි වුවොත් කුමන වෘත්තියක යෙදුණත් අපි අසාර්ථක යි. එනිසා සිල්වත් වීම පිණිස කැමැත්තක් ඇතිකර ගන්න ඕනෑ. ඒ සඳහා මේ කතාව කියවන්න.

මේ සිදුවීම සිදුවූයේ මහා සාගරයක් මැද නෞකාවක නැග ගත් හත්සියයක මහා පිරිසක් මුහුදු ගමනක් ගියා. මේ ගමන දින දෙක තුනක්. මහා සාගරය මැදට යන විට හදිසියේ ම නෞකාව අනතුරට පත්වුණා. නැවේ විශාල කොටසක් කැඩී ගියා.

දැන් නෞකාවට වේගයෙන් වතුර පිරෙනවා. නැව සාගරය මැද ගොඩබිමක් නො පෙනන ප්‍රදේශයක ගිලෙන්නයි සූදානම. නැවේ ඉන්න පිරිස කෑ ගසමින් විලාප තිබ්බා. අඬන්නට පටන් ගත්තා. වැළපුණා. "අහෝ අපට කාගේ පිහිටක් ද" කියා යදින්නට පටන් ගත්තා.

ඒ හත්සියයක් පිරිසක් හඬා වැළපෙන විට ඒ අයට පේනවා එක් පුද්ගලයෙක් කම්පාවක් නැතිව, තැති ගැනීමක්, හැඬීමක් නැතිව ඉන්නවා. ඒ පිරිස ඒ පුද්ගලයා අසලට ගොස් අසනවා

"කියන්න, මේ මහා නෞකාව, ගිලෙන්නට ළඟයි. ඔබට බයක්, වෙහෙසක් නැත්තේ ඇයි?"

"මම මගේ ජීවිතයට ආරක්ෂාවක් හදාගෙනයි ඉන්නේ ඒ නිසා මරණයට මට බියක්, තැතිගැනීමක් නැහැ. මට පිහිටක්, සරණක්, ආරක්ෂාවක් තිබෙනවා."

ඒ නැවේ විවිධ වෘත්තීන්හි නියැළුණු බොහෝ දෙනා හිටියා. ඒ අය ඉල්ලා සිටියා භීතිය නසන බලයක් පිහිටක් ඔබට තිබෙනවා නම් අපටත් ඒ අසිරිමත් රැකවරණය දෙන්න කියලා.

එවිට ඔහු කියනවා මම අවංකව ම තෙරුවන් සරණ ගිය කෙනෙක්.

ඒ වගේම මම තෙරුවනට පොරොන්දුවෙලා නිති පන්සිල් ආරක්ෂා කළ කෙනෙක්. මම මේ නැවට ගොඩවෙන්න කලින් උපෝසථ අෂ ්ඨාංග සීලය සමාදන් වුණා. දැන් මම උතුම් සීලයක පිහිටා සිටින කෙනෙක්. මට තිබුණු විශාල රැකවරණය එයයි. මේ ජීවිතය, ඖෂධ, ආහාර තිබූ පමණින් ආරක්ෂා කර ගත නොහැකියි. කාය බලය, ධන බලය තිබුණාට මේ ශරීරය ආරක්ෂා වෙන්නේ නැහැ. මරණය ඕනෑම මොහොතක මා වෙත එනවා කියලා මම දන්නවා" කියා ඒ පුරුෂයා කිව්වා.

අර හත්සියයක් පිරිස මේ අභීත පුරුෂයාගෙන් ඉල්ලා සිටියා

'අනේ අපටත් ඒ ආරක්ෂාව පිහිට දෙන්න" කියා, එවිට ඔහු නැව ගිලෙන්නට පෙර ඒ පිරිසට රැකවරණය දුන්නා. ඒ තෙරුවන් සරණයෙහි පිහිටුවා උපෝසථ අෂ්ඨාංග සීලයේ ඒ සියලු දෙනාම සමාදන් කරවීම යි.

ඔවුන් සිල් සමාදන් වී අවසන් වන විට නැව මුහුදුබත් වුණා. ඒ හැම දෙනාම මරණයට පත් වුණා. ඔවුන්ගේ ඥාතියකුට, හිතවතකුට, ධනයට, නිලයට, බලයට ඔවුන් බේරා ගැනීමට නොහැකි වුණා. ඔවුන් සමාදන් වූ සීලයටත් බැරිවුණා ඔවුන් බේරාගන්න. එහෙත් ඒ සරණයටත්, සීලයටත් පුළුවන් වුණා මිනිස් ලොව අත් හරිද්දී සුගති රැකවරණය සලසා දෙන්න.

සදහම් අහන්න පුළුවන්, සත්පුරුෂ ඇසුරක් ලැබෙන, පින්දහම් කර ගන්න පුළුවන් දෙව්ලොව ඒ සියලුම දෙනා ඉපදුණා. ඒ සීලයේ බලය යි. ඒ නිසා නිති පන්සිල් රකිමින් පුන් පෝ දිනට නො වරදවා ඔබත් උපෝසථ අෂ්ඨාංග සීලය සමාදන් වෙන්න රහතන් වහන්සේ, අරහත් උත්තමාවියෝ අනුගමනය කරමින් ඒ මුනිවරු මුනිවරයන්ගේ ජීවිත ගැන හිත හිතා තමන් ද උපෝසථ අෂ්ඨාංග සීලය සමාදන්ව රක්ෂා කරන්න. මේ ජීවිතය හැමදාම තිබෙන්නේ නැහැ. අපි දිනෙන් දින වයසට යනවා. මරණයට ළං වෙනවා. ඒ නිසා පෝ දින බාහිර සියලු වැඩ නවතා උතුම් සීලය සමාදන් වෙන්න.

විනෝද ගමන් යන්න, විසිතුරු දේ බලන්න, නිවෙස පිරිසුදු කරන්න ඒ දිනය තබා ගන්න එපා. ඒ උතුම් දිනය උතුම් දෙයක් වෙනුවෙන් වෙන් කරන්න පුරුදු වෙන්න.

නයනා නිල්මිණී



# සම්බුදු සසුනේ උන්නතිය වෙනුවෙන් ඇපකැප වූ මහා යතිවරයාණෝ

# බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේ



**මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනු නා හිමිපාණන් වහන්සේ අපවත් වී මෙම 03 වැනිදට වසර 5ක් සම්පූර්ණ විය. මේ ලිපිය උන්වහන්සේට ගෞරවය පිණිසය.**

**1942 අප්‍රේල් මස 14 දින ජන්ම ලාභය ලද මෙම පින්වත් කුලකුමරුවාණන්ගේ ගිහිකල නම වූයේ ඕමන්තගේ ගිල්බට් පෙරේරා ය.**

නිකපේ ශ්‍රී විජයරාජ පාසල, පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය හා වාද්දුව මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය ලැබූ එම කුලකුමරුවා වයස අවු. 13 දී එනම් 1956 පෙබරවාරි 28 වැනි දින බෙල්ලන්විල රාජමහා විහාරස්ථානයේ ස්වර්ණමය යුගයේ නිර්මාතෘ ලෙස සැලකෙන බෙල්ලන්විල සෝමරතන ලොකු හාමුදුරුවන් වෙතින් පැවිදි දිවියට ඇතුළත් වූහ.

1967 කැලණිය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත් 1972 විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් පාලි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධිය ගත් අතර, 1980 දී එංගලන්තයේ ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියත් ලබා ගන්නට සමත්වූහ.

පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙනේ ආචාර්යවරයකු ලෙස සිය ගුරු ජීවිතය ඇරඹූ උන්වහන්සේ රත්මලාන පරමධම්මචේතිය පිරිවෙනේ දැරූ පරිවේණාධිපති තනතුරෙන් ඉවත් වී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු ලෙස පූර්ණ කාලීනව සිය සේවාව ලබාදෙන ලද්දේ එම විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා සිසුන් දහස් ගණනකට දැනුම පෝෂණය ලබාදීමේ අරමුණිනි.

උන්වහන්සේ විශ්වවිද්‍යාල සිසුන් වෙනුවෙන් කරන ලද අනූපමේය සේවාව හා අනෙකුත් ආගමික, සමාජයීය හා ශාස්ත්‍රීය සේවාවන් ගැනත් සලකා බලා 2000 වර්ෂයේ දී උන්වහන්සේට විශ්වවිද්‍යාලයක් තුළින් ලැබිය හැකි ඉහළම තනතුර වන සම්මානනීය කුලපති පදවියෙන් පිදුම් ලැබීම උන්වහන්සේටත්, එම තනතුරටත් කරන ලද ගෞරවයක් ලෙස හඳුන්වා දිය හැකිය.

උන්වහන්සේගේ ජීවිත කාලය තුළ උන්වහන්සේ සතු වූ සුවිශේෂී ඥානය, බුදුදහම හා අනෙකුත් ආගම් පිළිබඳ තිබූ පුළුල් දැනුම උපයෝගී කර ගනිමින් උන්වහන්සේ විසින් රචිත ධර්ම ගවේෂණ ග්‍රන්ථ රාශියකි.

ඒ අතර බුදුවරු සහ බෝසත්වරු, බුද්ධාගම හඳුනා ගැනීම, බුදු පිළිමය, මුද්‍රා සහ ආසන, බුද්ධ ප්‍රතිමා කලාව සහ බුදු පිළිමයේ විකාශය, බෞද්ධ සම්ප්‍රදාය හා සංස්කෘතිය, බුදු පිළිමයට පෙර බුදුහාමුදුරුවෝ, අංගුත්තර නිකායේ සිංහල අනුවාදය, ප්‍රඥා පාරමිතා සාහිත්‍යය, බුදුදහම සාහිත්‍ය හා කලාව, නොසැලෙන මනස, බෞද්ධ මහා පුරුෂ සංකල්පය, මිනිසාගේ ආගම්, ඒ අතර ප්‍රධාන වේ. මෙයට අමතරව උන්වහන්සේ විසින් පුවත්පත්වලට රචනා කළ විචාර ලිපි ද රාශියකි. තවද උන්වහන්සේ විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ද ග්‍රන්ථ රාශියක් රචනා කළ අතර, ඒවා දෙස් විදෙස් බොහෝ පිරිසකගේ විශේෂ අවධානයට හා සම්මානයට පාත්‍ර වූ පොත් වශයෙන් ද හඳුන්වා දිය හැකි ය.

උන්වහන්සේ විසින් රචිත මෙම සෑම ග්‍රන්ථයකින් ම කියාදෙන්නට උත්සාහ ගෙන ඇත්තේ වර්තමානයේ මිනිසුන් තුළ පවත්නා විවිධාකාර වූ ප්‍රශ්න ගැටලුවලට ප්‍රායෝගිකව විසඳුම් දිය හැකි එකම දහම බුදුදහම බව පෙන්වා දීමට ය.

උන්වහන්සේ කිසි විටෙක කිසිවකුගෙන් හෝ ලාභ ප්‍රයෝජන, තාන්න මාන්න බලාපොරොත්තු නොවූ යතිවරයකු විය. මේ නිසාම උන්වහන්සේට කිසිවකුට ගැති නොවී තීන්දු තීරණ ගැනීමේ හැකියාවත්, ඕනෑම අයකුගේ වරදක් දුටුවිට එය විවෘතව විවේචනය කිරීමේ හැකියාවත් තිබුණි.

කිසිවිටෙකත් පදවි තානාන්තර පසුපස හඹා නොගිය උන්වහන්සේ ජාතික, ආගමික, ශාසනික පුනරුදය සඳහා සිය මතය අභීතව ප්‍රකාශ කළ භික්ෂූන් වහන්සේනමක් ලෙස ද ප්‍රසිද්ධියට පත්ව සිටියහ.

උතුම් මානුෂීය ගුණාංගවලින් පිරුණු උන්වහන්සේ මිනිසුන්ට පමණක් නොව සතා සීපාවට ද දැක්වූයේ අසීමිත ලෙන්ගතුකමකි. පාන්දර අවදිවන උන්වහන්සේගේ දින චර්යාව ආරම්භ වන්නේ විහාර භූමියේ ඇති ගහකොළ අතරේ ඇවිදිමින් කුරුල්ලන්ගේ ගී හඬට සවන්දෙමින් පිපී ඇති මල්වල සුවඳ හා අසිරිය විඳගැනීමෙනි. උන්වහන්සේගේ ඉල්ලීමකට අනුව බුරුම රජයෙන් පරිත්‍යාග කරන ලද "මියන්කුමාර්" ඇත් පැටවා ළඟට දිනපතාම ගොස් පලතුරුවලින් සංග්‍රහ කරන්නේද පියකු දරුවකුට සලකන ලෙන්ගතුකමකිනි. විහාරස්ථානයේ ගසක අත්තක් කැපීමට පවා විරුද්ධ වන උන්වහන්සේ ඒ තරමටම ස්වභාවික පරිසරය කෙරෙහි ආදරය දැක්වූහ.

ආගමික ශාස්ත්‍රීය කටයුතුවලට පමණක් සීමා නොවී සමාජ සේවා කටයුතු කෙරෙහි ද උනන්දු වී කටයුතු කළ ස්වාමීන් වහන්සේ නමක් ලෙස හඳුන්වා දිය හැකි ය. පාසල් හැරයන තරුණ පිරිස් ත්‍රීරෝද රථවලට යොමුවීම කෙරෙහි උන්වහන්සේ තුළ පැවතියේ බලවත් නොසතුටකි. ඒ වෙනුවට ඔවුනට කිසියම් හෝ දෑතේ පුහුණුවක් ලබාදී රැකියාවන්ට යොමුකිරීමේ අරමුණින් උන්වහන්සේ විසින් වෘත්තීය පුහුණු පාඨමාලාවන් රාශියක් විහාරස්ථානය තුළ ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

අද එය වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධ කර ඇති අතර, එයින් පුහුණුව ලැබූ විශාල පිරිසක් අද දේශීය හා විදේශීය රැකියාවන් හි නිරත වී සිටිති. එම වෘත්තීය පුහුණුව තුළින් ලබා ගන්නා වටිනා සහතිකය සිසුන් බොහෝ දෙනකුට දෙස් විදෙස් රැකියාවන් ලබා ගැනීමට පහසු වී ඇත.

එපමණක් නොව උන්වහන්සේ විහාරස්ථානයේ රථගාලෙන් ලැබෙන ආදායම විහාරස්ථානයේ කටයුතු සඳහා නොයොදවා එම මුදල සම්පූර්ණයෙන් ම ප්‍රදේශයේ වකුගඩු හා හෘද රෝගීන්ගේ සැත්කම් සඳහා අරමුදල් සපයන ගිණුමක් බවට පත් කර ඇත.

විමලරතන ස්වාමීන් වහන්සේ විහාරස්ථානයේ ශ්‍රී බෝධිරාජ දහම් පාසල ආරම්භ කරන ලද්දේ ළමුන්ට අධ්‍යාපනය පමණක් නොව ඔවුන්ට විනය හා ගුණගරුක බව ලබාදීමේ අරමුණිනි. අද එම දහම් පාසල දක්ෂ ආචාර්ය මණ්ඩලයක් යටතේ සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන් 2500කට අධික සංඛ්‍යාවක් සිටින අගනුවර ඇති ප්‍රධාන පෙළේ දහම් පාසලක් බවට පත්ව ඇත.

මාස 3කට වරක් කළුබෝවිල හා කොළඹ මහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරු කැඳවා ප්‍රදේශයේ අසරණ ජනතාවට නොමිලයේ බෙහෙත් ලබා දීම සඳහා වෛද්‍ය සායනයක් පැවැත්වීමත්, වසරකට වරක් ප්‍රදේශයේ දුප්පත් පවුලක් තෝරා ඔවුනට ඉඩමක් සහිත නව නිවෙසක් ඉදිකර දීමත්, ප්‍රදේශයේ අධ්‍යාපනය ලබන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පොත් හා ශිෂ්‍යත්ව ලබාදීමත් උන්වහන්සේ විසින් ආරම්භ කළ ප්‍රජා සත්කාරක සේවාවන් අතර වේ.

උන්වහන්සේගේ 5වැනි ගුණානුස්මරණ පින්කම වෙනුවෙන් උන්වහන්සේට පින් අනුමෝදන් කිරීම සඳහා පෙබරවාරි 02වැනි දින පූජ්‍ය තුම්බෝවිල ධම්මරතන නාහිමියන් විසින් ධර්ම දේශනාවක් පැවැත් වූ අතර, පෙබරවාරි 03 වැනි දින මහා සංඝරත්නය විෂයයෙහි දවල් දානය පිරිනැමිණි. ඊට සමගාමීව තවත් පින්කම් රැසක් සිදු කෙරිණි.

අපවත් වී වදාළ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමියන් වෙනුවෙන් සිදු කරනු ලබන මෙම හැම පින්කමක්ම බෙල්ලන්විල රාජමහා විහාරාධිපති, සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක, කඩුගන්නාව ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයේ නිර්මාතෘ ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නායක හිමියන්ගේ මූලිකත්වයෙන් සිදුකරනු ඇත.

විමලරතන හිමි වැනි උගත් බුද්ධිමත් යතිවරයාණන් වහන්සේ නමකගේ අභාවය නිසා ඇති වූ හිඩැස අපට කිසි දිනෙක සම්පූර්ණ කළ නොහැකි අඩුවක් වනු ඇත. දැයෙන් සමුගත් මෙම යතිවරයාණන් වහන්සේ සිදුකරන ලද සමාජ, ආගමික, ශාස්ත්‍රීය සේවාවන් සලකා උන්වහන්සේට ගෞරව කිරීමක් වශයෙන් දැනටමත් බෙල්ලන්තර බොරලැස්ගමුව ප්‍රධාන මාර්ගය "මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහිමි මාවත" ලෙස නම්කර ඇති අතර, ඉදිරි දිනක පවත්වන උත්සවයක දී උන්වහන්සේ වෙනුවෙන් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව මුල් දින කවරයක් නිකුත් කිරීමට ද කටයුතු සම්පාදනය කර ඇත.

සුපේෂල ශික්ෂාකාමී මහා සංඝපීතෘන් වහන්සේ නමක් ලෙස මුළු මහත් ලෝකවාසීන්ගේ භක්ත්‍යාදරයට පාත්‍ර වූ උන්වහන්සේගේ ඒකායන අරමුණ වූයේ ලොව ජාතීන් අතර, ජාතික සංහිඳියාව ඇති කිරීමයි. ඒ වෙනුවෙන් සර්ව ආගමික නායකයින් සමඟ එක්ව උන්වහන්සේ විශාල වැඩ කොටසක් නිහඬව ම ඉටු කළ සේක.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති තනතුර දරමින් ම උසස් අධ්‍යාපන කොමිසම, ජාතික අධ්‍යාපන ආයතනය, පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය, ලෝක බෞද්ධ සම්මේලනය වැනි ආයතන රාශියක නායකත්වය හා උපදේශක තනතුරු දරමින් ශාස්ත්‍රීය පොත පත ද ලියමින් උන්වහන්සේ අප රටට ජාතියට සිදු කරන ලද්දේ මිල කළ නොහැකි සේවාවකි.

මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි නම් වූ ඒ යතිවරයාණන් වහන්සේට අජරාමර නිවන් සුව අත්වේවා.

බෙල්ලන්විල රාජමහා විහාරස්ථ
දායක සභාවේ ලේකම්
**එල්.එස්. වනිගසිංහ**

# ජර්මන් භාෂාවෙන් ආචාර්ය උපාධිය දිනූ බහුශ්‍රැත පඬිරුවන



**සියාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ජර්මනියේ සමථබලසම්පන්න ප්‍රධාන සංඝනායක ජර්මනියේ බර්ලින් නුවර ශ්‍රී සම්බෝධි විහාරාධිපති ගම්පහ දෙරණෑගොඩ ශ්‍රී සුමන්තින්ද්‍රාරාම පුරාණ රාජමහා විහාරාධිපති හා සදානන්ද මහ පරිවේණාස්ථානයේ අධිපති ආචාර්ය සද්ධර්මකීර්ති භාෂාන්තර විශාරද**

## රඹුක්වැල්ලේ ශ්‍රී බුද්ධරක්ෂිත දේවානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

> **"නිවැරැදි ශාසනික ප්‍රතිපදව අනුගමනය කරමින් සුපේශල ශික්ෂාකාමී අර්ථචරියාවෙහි පිළිපන් සංඝ නේතෘන් වහන්සේලාගේ ආභාසය උන්වහන්සේගේ පැවිදි ජීවිතය ආලෝකවත් වීමට හේතු විය"**

**උට්ඨානවතො සතිමතො -**
**සුචිකම්මස්ස නිසම්මකාරිනො**
**සඤ්ඤතස්ස ච ධම්මජිවිනො -**
**අප්පමත්තස්ස යසොභිවඩ්ඪති**

යන බුදුවදනට අනුව "උත්සාහයෙන් මනා සිහිනුවණින් ස්වකීය කටයුතු මනා ලෙස ඉටුකරමින්, සංවරයෙන් යුතුව, ධාර්මිකව දිවි ගෙවන්නාගේ කීර්තිරාවය දිනෙන් දින දියුණුවට පත්වෙයි.

මේ බුදුවදනට අනුකූලව ගමන් කර ස්වකීය උත්සාහයෙන් මනා සිහිනුවණින් සහ සංයමයෙන් යුක්තව ධාර්මිකව තමාවෙත පැමිණි සියලු අභියෝග ඉතා දක්ෂ අන්දමින් ජයග්‍රහණය කළ සංඝ පීතෘවරයාණන් වහන්සේ දෙස් විදෙස්හි යශෝරාවය පතුරවමින් වැඩ සිටිති.

ගම්පහ දොරණෑගොඩ ශ්‍රී සුමන්තින්ද්‍රාරාම පුරාණ රාජමහා විහාරාධිපති හා සදානන්ද මහ පිරිවේණස්ථානයේ අධිපති ජර්මනියේ බර්ලින් නුවර ශ්‍රී සම්බෝධි විහාරාධිපති ආචාර්ය සද්ධර්මකීර්ති භාෂාන්තර විශාරද ජර්මනියේ සමථබල සම්පන්න ප්‍රධාන සංඝ නායක පූජ්‍ය රඹුක්වැල්ලේ ශ්‍රී බුද්ධරක්ෂිත දේවානන්දාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විදේශීය ධර්මදූත ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට ශාසනික කාර්යභාරයක නියැළී සිටින එවැනි බහුශ්‍රැත පඬිරුවනක් වශයෙන් හැඳින්විය හැකිය.


භික්ෂූන් වහන්සේට අයිති කාර්යභාරය කුමක්ද යන්න අවබෝධ කරගෙන රඹුක්වැල්ලේ දේවානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සිදුකරන අත්‍යුදාර ශාසනික සේවය ජාත්‍යන්තර ප්‍රජාවගේ ද ප්‍රශංසාවට පාත්‍ර වේ.

දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක නිලමේතුමාගේ හා කුලසේකර මුදියන්සේලාගේ පුංචි මහත්මා යන ශ්‍රද්ධා බුද්ධි සම්පන්න මව්පිය දෙපළගේ පුත්රුවනක් වශයෙන් ඓතිහාසික මහනුවර තෙල්දෙනිය රඹුක්වැල්ල ප්‍රදේශයේ දී ජන්මෝත්පත්තිය ලැබූ නාහිමිපාණන් වහන්සේ සංසාරගතව පුරණය කරන ලද පාරමිතා බල මහිමයෙන් 1978 වර්ෂයේ දී රඹුක්වැල්ලේ දේවානන්ද යන උත්තරීතර ශාසනික නාමයෙන් උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ ප්‍රව්‍රජ්‍යාභාවය ලබා ගත්හ. එවකට දොරණෑගොඩ ශ්‍රී සුමන්තින්ද්‍රාරාමාධිපති හා සදානන්ද මහ පරිවේණාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ රාජකීය පණ්ඩිත රඹුක්ැල්ලේ ශ්‍රී බුද්ධරක්ෂිත ප්‍රඥසාරාභිධාන සීනාදී සිවු කෝරළයේ ප්‍රධාන සංඝනායක නාහිමිපාණන් වහන්සේ හා සදානන්ද මහ පරිවේණාස්ථානයේ අධ්‍යක්ෂ කුරුකොහොගම ශ්‍රී බුද්ධරක්ෂිත ජිනානන්දාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යන සාර්වභෞම පාණ්ඩිත්‍යයෙන් සංඝ සෝභන ගුණයන්ගෙන් පිරිපුන් මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යවරුන් වූහ.

නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කරමින් සුපේශල ශික්ෂාකාමී අර්ථචරියාවෙහි පිළිපන් සංඝ නේතෘන් වහන්සේලාගේ ආභාසය උන්වහන්සේගේ පැවිදි ජීවිතය ආලෝකවත් වීමට හේතු විය.

ලංකා ශාසනම්බරය ආලෝකවත් කළ දීප්තිමත් පරිවේණස්ථානයක් වුණ දොරණෑගොඩ ශ්‍රී සුමන්තින්ද්‍රාරාම රාජමහා විහාරස්ථ සදානන්ද මහ පිරිවෙනින් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ උන්වහන්සේ ප්‍රාචීන විභාග සමත්වීමෙන් අනතුරුව උසස් පෙළ විභාගයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍යයා ලෙස කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව ප්‍රථම පන්ති ගෞරව සාමාර්ථයක් සහිතව සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්හ.

1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා විදේශීය ධර්ම දූත සේවය සඳහා ජර්මනියේ බර්ලින් විහාරයට වැඩම කළහ. සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාවන්ට




අමතරව ජර්මන් භාෂාව පිළිබඳ හසළ දැනුමක් ලබා ගත් උන්වහන්සේ ජර්මන් භාෂාව මාධ්‍ය කොට ආචාර්ය උපාධියක් ලබා ගත් ප්‍රථම භික්ෂූන් වහන්සේ වශයෙන් ද කීර්තියක් උසුලනු ලබයි.

තවද දෙවන ලෝක සංග්‍රාමයේ දී මියගිය ලක්ෂ සංඛ්‍යාත ජනතාව වෙනුවෙන් ජර්මනියේ හිටපු ජනාධිපති ආචාර්ය රිචර්ඩ් පොන් වෛසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බර්ලින් නුවර ජර්මන් පාර්ලිමේන්තුවේ දී ගුණානුස්මරණ උත්සවයක් පවත්වනු ලැබූහ.

1994 මැයි මස 30 වැනි දින පවත්වනු ලැබූ එම උත්සවය සඳහා ආගමික නායකයන් මෙන්ම රාජ්‍ය නායකයන් ද විශාල ප්‍රමාණයක් සහභාගි වූහ. එහිදී ජර්මන් පාර්ලිමේන්තුවේ දී බුදුදහම වෙනුවෙන් ජර්මන් භාෂාවෙන් දේශනයක් සිදුකළ එකම ශ්‍රී ලාංකිකයා වීම ද, එකම භික්ෂූන් වහන්සේ නමක් වීම ද යන සුවිශේෂී දුර්ලභ අවස්ථාව උන්වහන්සේට හිමි විය.

2002 වර්ෂයේ දී ප්‍රථම වතාවට ජර්මනියේ බර්ලින් නුවර ශ්‍රී සර්වඥධාතු ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු කළ නා හිමිපාණන් උන්වහන්සේ එම ධාතූන් වහන්සේ අමෙරිකා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චෛත්‍යයක් තනවා එහි නිධන් කිරීමට ද කටයුතු කළහ. අති විශාල විදේශීය සැදැහැවතුන් පිරිසකගේ වන්දනාවට පාත්‍ර වූ එම ධාතු ප්‍රදර්ශනය පැවැත්වීම නිමිත්තෙන් උන්වහන්සේ තායිලන්තයේ සංඝරාජ හිමිපාණන් වහන්සේගේ ගෞරව සම්භාවනාවටත් පාත්‍ර වූහ.

බර්ලින් නුවර විහාරස්ථාන 52 ක් ඒකරාශී කර ගනිමින් වාර්ෂිකව වෙසක් උත්සව පැවැත්වීමට කටයුතු කරන නාහිමිපාණන් වහන්සේ රජයේ පාසල්වල බුදුදහම ඉගැන්වීම සඳහා "ධර්මදූත" නමින් ජර්මන් භාෂා සඟරාවක් පළකිරීමට ද ක්‍රියා කර ඇත. ජර්මනියේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යවරයකු වන උන්වහන්සේ ජර්මන් හුම්බෝල්ට් ජාතික විශ්වවිද්‍යාලයේ ලෝක ආගමික හා දර්ශන පීඨයේ කථිකාචාර්යවරයකු වශයෙන් ද කටයුතු කරනු ඇත.

නාහිමිපාණන් වහන්සේ ජර්මනියේ බර්ලින් නුවර ශ්‍රී සම්බෝධි විහාරය ද ආරම්භ කළහ. ශ්‍රී ලාංකික අපට ලොවට දිය හැකි උතුම්ම දායාදය ථෙරවාදී බුදුදහමයි. ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ ගණනාවක් ම සම්පාදනය කොට බුදුරජාණන් වහන්සේගේ සදහම් පණිවිඩය ලෝකයාටම බෙදාදීමේ මහඟු කාර්යයක නියැළුණු පූජ්‍ය රඹුක්වැල්ලේ දේවානන්ද නායක මාහිමිපාණෝ සැබෑ ධර්මදූතයාණන් වහන්සේ නමක ලෙස බොහෝ ජනයාට හිතසුව පිණිස සේවය කිරීම බෞද්ධ ලෝකයට ම මහත් වූ ආදර්ශයකි.

වසර 25 කට අධික කාලයක් බුදුදහම හා බෞද්ධ දර්ශනයේ හරය යුරෝපීයයන්ගේ ජීවිත වෙත සමීප කරමින් සිදුකළ ලෝක ආගමික ශාසනික සේවය සම්භාවනාවට පාත්‍ර කළ ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක ධර තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ විංශත් වර්ගික කාරක මහා සංඝ සභාව මඟින් සද්ධර්මකීර්ති ශ්‍රී බුද්ධරක්ෂිත භාෂාන්තර විශාරද සමථබල සම්පන්න ප්‍රධාන සංඝනායක ධුරය පිරිනැමීමට ද කටයුතු කර ඇත.

අප මාතෘභූමියේ කීර්ති නාමයත්, ශ්‍රී ලාංකික අනන්‍යතාවත්, බෞද්ධාගමික ගෞරවයත් ආරක්ෂා කරමින් කරගෙන යන්නා වූ ජාතික, ආගමික ලෝක ශාසනික සේවාව තවදුරටත් කරගෙන යාම සඳහා ආචාර්ය පූජ්‍ය රඹුක්වැල්ලේ දේවානන්ද නායක මාහිමිපාණන් වහන්සේට නිදුක් නිරෝගී සුවය සමඟ චිරජීවනය බැතිබර පූර්වකව ප්‍රාර්ථනා කරමි.

**හේමමාලා රන්දුනු**




# සිහියට නැඟ එයි එදවස දුටු විසිතුර...



සම්බුදු සමිඳු ගෞතම අපෙ මුනිඳු
බුදුවී ලොව්තුරා අටමසකින් පසිඳු
උරුවෙල් දනව්වේ දුරලා අවිදු අඳු
දමනය කළේ ජටිලයො දුරු කර අඳු

සිදුහත් කුමරු ගිහිගෙය හැර යන මඟට
හමුවුණු නිරිඳු එදවස සිටි මගධ රට
බුදුවී පසුව වඩිනා ලෙස සියර ටට
බිම්බිසාර රජු කීවේ බෝසතුට

ලැබූ පසු බෝසතුන් පදවිය සම්බුදු
වැඩියා මගධ රට සිහිකර යළිදු
දෙව්රම් වෙහෙර කරවා මහ නරනිඳු
දුරුතු පොහෝ දා පිදුවා සසුනට බුදු

හෙළදිව එදා මහ උයනේ මහනාග
ඇවිලුණු අරගලය මහ යක් හා නාග
දිවැසින් බලා බුදු රජ සලසන්නට යහමඟ
විගසින් වැඩියෙ ලක්දීපෙට ගුවන් නැඟ

අමෝරා සිටිද්දි යක් දන නෙක නෙක අවි
දමනය කරන්නට යෙදුවේ බුදු සමිඳු සවි
මහාමේඝ අකුණු ද මහවැසි පෙළට මැවී
බියවුණු යකුන් දිව්වා ගිරිදිවට නැවී

මහියංගනේ යක් සේනා දමනයට
වැඩිදා බුදුහිමි මේ හෙළදිවට
සමන් සුරිඳු වැඳ බුදු සමිඳුන්ට
ලැබුවේ කේශධාතූන් වැඳ පුදන්නට

**ඒ.එම්.අබේසිංහබණ්ඩා**
*මාපනාවතුර – මහනුවර*

# භෝග විනාශ මුඛ

මත්වෙන පානයට පසුපස වැටීම
සිත් යන සූදුවට ප්‍රිය ලෙස ඇලීම
රත්වෙන පාදයට ගයමින් නැටීම
ලත් තැන කාලයට මඟතොට සැරීම

මිතුරන් පාප ඇසුරේ දිවි ගෙවීම
අලසින් නේක තැන වැතිරී සිටීම
මෙලසින් භෝග වනසන මුඛ දැරීම
දෙසුවෙන් සමිඳු නොකරමු ධන නැසීම

**පී.බී. ගුණරත්න**
*අධ්‍යාපනවේදී විශ්‍රාමලත් පරිවේණාචාර්ය.*

# යශෝධරාවනි

අනිස ලෝ දම් අතර
සදාකාලිකබවේ රිද්මය
ඔබගෙ ආදර කතාවයි
ලොවම ගයනා ගීතයයි
නිමල ප්‍රේමයෙ කැඩපතයි

**කිතුල්ගල**
**රත්නසේකර**
**රූපසිංහ**

# ගුණ දම්



ලොවක් බලන්නට දෙනයන ලැබුණ පිනෙන්
දෙවරක් බලා වදනක් කිව යුතු ය මුවෙන්
සිත් සැනසෙන්න දොඩමලු වී මුදු වදනින්
ජීවත් වෙන්න සැමට සුව දෙන අයකු ලෙසින්

සොබා දම් මව දායාද කර දුන් තුරුලිය
හොඳ නැහැ කිසි දිනක වනසාලන්න
පණ ඇති තුරුලිය අඬනවා ලෝකෙට නොදැනෙන්න
හෙමිහිට වැටෙනවා කඳුළැලි මිහිතලය පිට

**පානදුර අරුක්ගොඩ ඩබ්.පී. ඉන්ද්‍රාණී.**

*"80 වැනි ජන්ම දිනය සමරන මාගේ ආදර අම්මාට මෙතෙක් ජීවන මඟ පැවැති දුක්, කම්කටොලු ජයගෙන දරු සයදෙනකුට අම්මා වෙලා එකම පුතා පණ මෙන් රැක බලා හිමි අහිමිව ගියද පටන් කඳුළු නොහෙලා සිත දැඩි කර ඉදිරිය සැහැල්ලුවෙන් කාලයට ඉඩ දී සතුටින්, සැදැහැතිව නිවන් මඟ යන ගමන් මඟ හමුවේවා'යි! ආසිරි පතමි.*

"මව් ගුණ ගී ගයමි ගොතා –
පියතුමහට නිවන පතා
මතු භවයක සසර පුරා –
එම් අප සැම පෙරුම් පුරා"

**ශ්‍රියානි චන්ද්‍රලතා**
*රාවතාවත්ත - මොරටුව*



# ඔවදනක්

ජීවන ගමන් මඟ දුක සැප සමව ගෙන
සිඟිති පුතුගෙ හසරැල් අම සුවය දෙන
සුරතල් දෝණිගෙ මුව ගෙන වැලඳ ගෙන
වෙන සතුටක් ඇතිද? මිහිපිට කියනු මැන

මත්කුඩු මත්වතුර කිසිවිට ගන්න එපා
නොමනා අයගෙ ඇසුරට ඔබ යන්න එපා
නිවසින් බැහැර වී රැය ගත කරනු එපා
නිවසට පැමිණි බිරිඳට දොස් නඟනු එපා

ලොව ඇති සියලු රස එක්තැන් වී ඇත්තේ
තම නිවහනෙහි බව සිහියට ගත යුත්තේ
ලද පමණින් තුටුවීමයි කළ යුත්තේ
එවිටය ගෙපැල සිරිමැදුරක සිරි ගත්තේ

**කේ.පී.ලලිතා පද්මිණී**
*විශ්‍රාමික තැපැල්සේවා නිලධාරිනී*
*පරෙයිගම*

# අවනඩුව

පද ගළපා කියනු කොහොම වූ අවනඩුව
පසුගිය දිනක සිදුවුණි පෝයට පෙර මහව
බණ ගෙදරකටයි ගියෙ ඇඳගෙන සුදු පිරුව
නොසිතූ ලෙසිනි වැටුණේ මහ වැසි පාකර කලුව

බාරගත් ලෙස අරගෙන ආවේ කුඩයක් පිරිකරට
ඉවසනු බැරි තැන ඉහලුවා කිරිසප්පයා තෙමෙනවට
පය ඉක්මන් කර ගෙට ගොඩවුනේ අවිද මයිල අට
දැන් මේක දෙන්න බෑ! නෑනා ගොඩවුනි ඇඟට

පව් සිදුවුනේ නෑ පෙරදා වැටුණු මල් සෝදා පිදුවට
තවකෙක් තම උතුරු සලුව සෝදා පිදුවලු මහ සෑයකට
කිරිසප්පයට ඉහලූ කුඩය සෝදා දෙන්නම් දැනට
පව්නෑ පූජා කරමු ඇත්හැර බොරු කහට

**වී.එස්.ශර්මිලා**
*කිරිමැටියාගාර , කඩවත*



# ඇය ද මවකි

දරු සෙනෙහස නිසා වෑහෙන කිරි ගංගා
දුන්නා මිනිසුනට වෙනසක් නොම පෙන්නා
ඒ කිරිවලින් පිරිපුන් බව ලැබ ගන්නා
උන් සැම කටී වින ඔබ හට නැත පෙම්මා

රිය සක අදින්නට ගොන් කුර සවි වූයේ
කමතේ බැත මඩින අම්බරු දැඩි වූයේ
බර වැඩ කරන්නට ගවයින් සවි වූයේ
දුන් කිරි නිසයි නැහැ එය සීමා වූයේ

දීලා දෙපා සතුනට කිරි දිවිය පුරා
පස්ගෝරසින් උන් සතපා සතුටු කළා
ලැබ දී ගොම පොහොර මිහිකත තුරුණු කළා
දිරපත් වූ ඔබව 'මරණෝට' නියම කළා

**සුදත් විජේසුන්දර**
*(අමෙරිකා එක්සත් ජනපදය)*

බුදුසරණ

# පහන් සිතක කවි

**සම්පූර්ණ නම** :– ..........................................................................
**ලිපිනය** :– ..........................................................................
**දුරකථන අංකය** :– ..........................................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**



# ස්වර්ණ වර්ණයෙන් සැරසෙන ඓතිහාසික කන්දේ විහාරය

**ඓතිහාසික අලුත්ගම්බද්දේ ශ්‍රී ක්ෂේත්‍රාරාම කන්දේ විහාරයේ අභිනව විහාරාධිපති පූජ්‍යපාද කොක්කාවිට විපුලසාර මාහිමිපාණන් වහන්සේගේ නව පරිපාලනය යටතේ  සංවර්ධන ව්‍යාපෘති රැසක් කෙරෙමින් පවතින ආකාරය මේ දිනවල කන්දේ විහාරයේ සැම අතෙකම දිස්වන්නකි.**

**ගරුතර මෙසිරිලක තොටමුණය කළුතර**<br>
**සිරිපිරි අලුත්ගම් බද්දේ නම් පවර**<br>
**පරසිඳු නෙක ලෙසින් යුත් කන්දේ වෙහෙර**<br>
**කළ සිතුවම් බල සකි බබළන නිතර**

**දෙව් මිත් යති තුමා කරපාගල පොරණ**<br>
**අව් රස් එ යති බෙන්තර තෙරිඳු සසොබන**<br>
**සව් සත් ලොබ වඩන මෙම වෙහෙර පෙරදින**<br>
**සිව් තිස් වස දහස් සත්සිය පුරාතන**

ඓතිහාසික අලුත්ගම්බද්දේ ක්ෂේත්‍රාරාම කන්දේ විහාරය ආරම්භය ක්‍රි.ව. 1734 සිදු වූ බව එහි සමන් දේවාලයේ බිත්තියක ලියා ඇති ඉහත පද්‍ය දෙකෙන් කියැවේ.

රුහුණේ ඉතිහාසය ගැන දැඩි උනන්දුවක් දැක්වූ හා ඒ ආශ්‍රිත ඓතිහාසික නවකතා හා ශාස්ත්‍රීය ලිපි රැසක් පළ කළ මහාචාර්ය බන්දුසේන ගුණසේකර වියතුන්ගේ මතය අතීතයේ කැලණි ගඟෙන් හා මහවැලි ගඟෙන් පහත සමස්ත ප්‍රදේශය ම රුහුණ වූ බවත්, කාලය ගෙවෙද්දී එම මායිම කෙමෙන් පහතට එමින් අවසානයේ බෙන්තර ගඟට සීමා වූ බවත් ය.

අෂ්ඨ මහා විහාරයන්ට අයත් ගලපාත විහාරයේ ඉතිහාසය ලක්දිව බුදු සසුන ස්ථාපිත කළ දේවානම්පියතිස්ස රජ දවස දක්වා ම දිවෙනා බව කියැවේ. පසුව දකුණ ඒකරාශී කළ කාවන්තිස්ස රජතුමා ගව්වෙන් ගව්ව වෙහෙර විහාර ඉදිකිරීම යටතේ මෙම විහාරය මුල්තැන්හි සංවර්ධනය වූ බවත්, ඉක්බිති එළාර රජු ජය ගෙන ඒකීය තුන් සිංහලයේ මහ රජු ලෙස කිරුළු පැළඳි දුටුගැමුණු රජතුමා සිය සොයුරු සද්ධාතිස්ස කුමරු අත මහා කාශ්‍යප රහතන් වහන්සේගේ දළදා ධාතූන් වහන්සේ බෙන්තර ගල තුරු මුල විහාරයට එවූ බවත්, ඒ ධාතූන් වහන්සේ වැඩම වූ පෙරහර පසුව අද වාර්ෂිකව පැවැත්වෙන බෙන්තොට දළදා පෙරහරේ මූලාරම්භය බවත් කියැවේ.

එම ගලපාත විහාරයෙන් බිහි වූ සඟ පරපුර නැවත බෙන්තර ගඟෙන් එතෙරට වැඩම කොට බස්නාහිර පළාතේ වැඩසිටිමින් රුහුණේ උරුමය රකින මහා පින්බිම ලෙස ඓතිහාසික අලුත්ගම්බද්දේ ක්ෂේත්‍රාරාම කන්දේ විහාරය හැඳින්විය හැක.

බෙන්තොට ගලපාත විහාරයෙහි වැඩවාසය කළ දෙද්දුව ධම්මානන්ද යතිවරයන් වහන්සේගේ ශිෂ්‍ය උඩුගම චන්දසාර තෙරුන් වහන්සේ ක්‍රි.ව. 1734 වසරෙහි මෙම පින්බර කඳුගැටය මත ප්‍රථම වස්විසීම ඓතිහාසික අලුත්ගම්බද්දේ
ක්ෂේත්‍රාරාම කන්දේ විහාරයෙහි ආරම්භය බව කියැවේ.

පසුව උන්වහන්සේගේ ශිෂ්‍ය කරපාගල දේවමිත්ත තෙරුන් වහන්සේ වෙත මෙම කන්දේ විහාරය පවරා නිත්‍ය නේවාසික යතිවරයාණන් ලෙස එහි ආවාසගෙය සහ අනෙකුත් විහාරාංග නිර්මාණය කරවන්නට යෙදී ඇත.

ඉක්බිති පිළිවෙළින් බෙන්තර සෝණුත්තර, මහගොඩ ධම්මදස්සී, මාලේවන සුමන, මාලේවන සීලවංස, පින්නගොඩ අත්ථදස්සී යන මහා ස්ථවිරයන් වහන්සේ කන්දේ විහාරාධිපති පදවිය ඉසිලූහ.

පින්නගොඩ අත්ථදස්සී නාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍ය පොතුවිල සරණතිස්ස හිමිපාණන්ගේ යුගය කන්දේ විහාරයේ ස්වර්ණමය යුගය යැයි කියැවේ. 1885 වසරෙහි කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණට ඇතුළත්ව එහි පරිවෙණාධිපතිව වැඩවිසූ බෝධිසත්ව ගුණෝපේත හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ සෙවණේ දීප්තිමත් ශිෂ්‍යවරයෙක් ලෙස 1901 වසරේ රාජකීය පණ්ඩිත ශ්‍යාමරාජ ත්‍යාගය දිනාගත් උන්වහන්සේ 1904 වසරේ කන්දේ විහාරස්ථ ක්ෂෙත්‍රාරාම පිරිවෙන ආරම්භ කළහ.

ඒ ආගමික හා අධ්‍යාපනික සේවාවේ විශේෂිතම කාර්යයක් වූ, පොතපත එළිදැක්වීම දුලබ එවක උන්වහන්සේගේ සංස්කාරකත්වයෙන් පළ කළ වාගීශොදය ශාස්ත්‍රීය සංග්‍රහය එළි දැක්වීම ක්ෂෙත්‍රාරාම පිරිවෙන් ඉතිහාසයේ රන් සලකුණකි.

පසුව එළැඹී ලෝක මහා යුද්ධය සමඟ වසා දැමුණු ක්ෂෙත්‍රාරාම පිරිවෙන 1971 වසරේ නැවත ආරම්භ කෙරුණේ හීනටියන්ගල ජිනාරාම නාහිමිපාණන් වහන්සේගේ යුගයේ දී ය.

උන්වහන්සේගේ ශිෂ්‍යවරයන් වූයේ බටුවන්හේනේ බුද්ධරක්ඛිත, අරම ධම්මතිලක, යටදොළවත්තේ අරියවංස, කොක්කාවිට විපුලසාර හිමිපාණන් වහන්සේලා ය. ජිනාරාම නාහිමිපාණන් වහන්සේ අපවත්වීමෙන් උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යවර බටුවන්හේනේ බුද්ධරක්ඛිත නාහිමිපාණන් වහන්සේ කන්දේ විහාරාධිපති පදවියට පත්වූහ. ඒ වන විට පරිවෙණාධිපති ධුරය හෙබවූයේ උන්වහන්සේගේ පැවිදි සහෝදර යටදොළවත්තේ අරියවංස මාහිමිපාණන් වහන්සේ ය.



*ඓතිහාසික කන්දේ විහාරාධිපති*
*විනයාචාර්ය*
*කොක්කාවිට විපුලසාර නා හිමි*

කන්දේ විහාරයේ දීප්තිමත්ම යුගය ආරම්භ වන්නේ ඉන් පසුව බව බොහෝ අයගේ අදහසයි. කන්දේ විහාර පින් බිමත්, ඒ හා බැඳුණු අනෙකුත් විහාරස්ථාන වන අලුත්ගම ගණේගම පූර්වාරාමය, කාලවිල ශ්‍රී සුදර්ශනාරාමය, තොටකනත්ත කුසුමරුක්ඛාරාමය, කොළඹ, මරදාන තිස්සාරාමය යන විහාරස්ථාන ද වැඩිදියුණු කරමින් විහාරාංග ඉදිකරමින් ද, පන්සලෙන් බැහැර පාසල් ගොඩනැඟිලි, සමිති සමාගම් සඳහා ආධාර කිරීම්, පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම් මෙන්ම දුප්පතුන්ට, රෝගීන්ට, ලේඛකයන්ට, කලාකරුවන්ට උදව් උපකාර කරමින් ද උන්වහන්සේ කටයුතු කළේ නූතන වෙසතුරු රජෙකු ලෙස බව කාගේත් මතයයි.

මේ අතර ඉහත කී සහෝදර ශිෂ්‍ය සමාගමයේ කොක්කාවිට විපුලසාර හිමිපාණන් වහන්සේ කන්දේ විහාරයේ ආගමික හා ජාතික සේවාවන් ජාත්‍යන්තරයට ද ගෙන යමින් අමෙරිකාවට වැඩම කර අමෙරිකාවේ ප්ලොරිඩා බෞද්ධ විහාරස්ථානය ආරම්භ කරමින් ධර්ම සේවාවේ යෙදෙන අතරම කන්දේ විහාරයේ සම්බන්ධතාව ද රැක ගනිමින් වැඩ විසූ නමුදු පරිවෙණාධිපති යටදොළවත්තේ අරියවංස මාහිමි රෝගාතුර වීමත් සමග උන්වහන්සේට නැවතත් කන්දේ විහාරස්ථානය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නට සිදු විය.

යටදොළවත්තේ මාහිමිපාණන්ගේ අපවත්වීමෙන් පසු නැවත අමෙරිකාවට වැඩම කළ ද බුද්ධරක්ඛිත නාහිමිපාණන් වහන්සේ ද ගිලන් වීමත් සමඟ ආපසු කන්දේ විහාරයට වැඩම කරන්නට විපුලසාර මාහිමිපාණන්ට සිදු විය.

2018 දෙසැම්බරයේ බටුවන්හේනේ බුද්ධරක්ඛිත නාහිමි අපවත්වීමෙන් පසු චාරිත්‍රානුකූලව සංඝ සභාවේ හා දායකකාරකාදීන්ගේ සම්මුතියෙන් ක්ෂෙත්‍රාරාම කන්දේ විහාරස්ථානයේ විහාරාධිපති තනතුරට පත්වන්නේ කොක්කාවිට විපුලසාර මාහිමිපාණන් වහන්සේ ය.

විපුලසාර මාහිපාණන් වහන්සේ නව විහාරාධිපති පදවි ප්‍රාප්ත පුණ්‍යෝත්සවයේ දී එම පදවිය බාර ගනිමින් වදාළේ “මා, මේ ඓතිහාසික කන්දේ විහාරයේ අධිපතිභාවය නොව භාරකරුවාගේ මෙහෙවර බාර ගන්නා බවත්, විහාරස්ථානයේ ආරම්භක හිමිපාණන් වහන්සේගේ සිට බුද්ධරක්ඛිත නාහිමි දක්වා විහාරාධිපතින් වහන්සේලා කරගෙන ආ ආගමික හා සාමාජයීය මෙහෙවර වඩාත් යහපත් ආකාරයෙන් හා මනා කළමනාකාරීත්වයකින් ඉදිරියටත් පවත්වාගෙන යන බවත්, මෙම පින්බිම සතු කිසිදු සාංඝික දේපළක්, ධනයක් නුසුදුසු ආකාරයෙන් නොයොදවන බවත්”ය.

එතැන් සිට අද දක්වා අප නව විහාරාධිපති විපුලසාර නාහිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි කන්දේ විහාරය පරිපාලනය වඩාත් ක්‍රමාණුකූලව ද, තව තවත් දියුණුවට පත්වෙමින් ද ඇති අපූරුව විහාරස්ථානයට පැමිණෙන කාටත් මැනැවින් දකින්නට ලැබේ.

ඒ අතර විහාර මන්දිරයට පිවිසෙන වාහල්කඩ හා ප්‍රාකාරය නවීකරණය, විහාර භූමිය ගල් ඇතිරවීම, පහන් ශාලාව, සම්බුදු තෙමඟුල මූර්තිමත් තොරණ සහ එතැන පිවිසුම් දොරටුව ඉදිකිරීම දැනට සිදු කෙරී ඇති අතර, විහාරස්ථානයට පිවිසෙන ප්‍රධාන මාර්ගය දෙපස ප්‍රාකාර නුවර පෙරහර මූර්තිමත් කරමින් නවීකරණය කිරීම මේ දිනවල සිදු කෙරෙමින් පවතී.

කන්දේ විහාරයේ සංකීර්ණ ම කාර්යය වන්නේ සිව් මහල් ගොඩනැගිල්ලක් මත පිහිටුවා ඇති දකුණු ආසියාවේ විශාලතම හිඳි බුදු පිළිම වහන්සේ ගෞරවනීය ආකාරයෙන් පවත්වාගෙන යාම ය. එහි අලුත්වැඩියා කටයුතු යනු පහසුවෙන් කළ හැකි කාර්යයක් නොවේ. එය මනා ඉංජිනේරු උපදෙස් හා නවීන තාක්ෂණය උපරිමව අත්‍යවශ්‍ය වන්නකි. ඒ නිසාවෙන් ම කලකින් අලුත්වැඩියා නොකෙරුණු මහ බුදුපිළිම වහන්සේගේ අලුත්වැඩියා කටයුතු හා තීන්ත ආලේප කිරීම ආරම්භ කිරීමට ඇවැසි කටයුතු සියල්ල මේ වන විට සාකච්ඡා කර ඇත.

ඓතිහාසික අලුත්ගම්බද්දේ ක්ෂෙත්‍රාරාම කන්දේ විහාරය හා අමෙරිකාවේ ප්ලොරිඩා බෞද්ධ විහාරය යන උභය විහාරාධිපති, පූජ්‍යපාද කොක්කාවිට විපුලසාර නාහිමිපාණන් වහන්සේගේ උදාර සාසනික සේවාව පිළිබඳ කැපවීම කන්දේ විහාර ඉතිහාසයට එක් කරමින් මේ සියලු කටයුතු අවසන්ව, එළඹෙන වෛශාඛ මංගල්‍යයේ දී කන්දේ විහාරය ස්වර්ණ වර්ණයෙන් බබළන ආකාරය දැකගත හැකි වනු ඇත. තිසරණ බෙලෙන් ඒ සියලු කටයුතු සාර්ථක වේවා යි අපි ද ප්‍රාර්ථනා කරමු.

*සටහන සහ ඡායාරූපඃ*
***නිහාල් අකුරුගොඩ***